**විසර්ජන ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ හා ක්‍රීඩා සංගම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව
**2** කොටස එක් එක් විසර්ජන ශීර්ෂයන්ට - අදාළ විස්තරාත්මක වාර්තා

**I –කොටස**

**ක්‍රීඩා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| විසර්ජන ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව<br>ක්‍රීඩා සංගම් |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,100,500,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,363,159,499 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් රු.144,644,576 ක් හා රු.592,695,925 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35.7 ක් හා සියයට 61.8 ක්ව පැවතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු | රු | රු | රු | රු |
| 136 | ක්‍රීඩා අමාත්‍යාංශය | 270,465,000 | 279,330,000 | 220,475,332 | 184,675,092 | 49,989,668 | 94,654,908 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 281,535,000 | 1,269,170,000 | 262,376,859 | 695,632,216 | 19,158,141 | 573,537,784 |
| | එකතුව | 552,000,000 | 1,548,500,000 | 482,852,191 | 880,307,308 | 69,147,809 | 668,192,692 |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංක | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 136 | 136011 | 7,000,000 | 4,663,294 | 2,000,000 | 6,096,263 | 24,000,000 | 12,946,975 |
| 219 | 219011 | 8,000,000 | 6,746,778 | 4,000,000 | 8,672,743 | 33,000,000 | 24,218,283 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල 2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.139,474,973 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0048/000 | 13,507,441 |
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0100/000 | 125,967,532 |
| එකතුව | | 139,474,973 |

**2 - කොටස**

**එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1. විසර්ජන ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන

යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 පෙබරවාරි 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචන හා පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ක්‍රීඩා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි පොදු නිරීක්ෂණ සහ 1.4 සිට 1.8 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක. 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| (ii) | 2002 නොවැම්බර් 18 දිනැති අංක අයි.ඒ.අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |

## 1.4 වත්කම් කළමනාකරණය

**බේරුම් නොකළ බැරකම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ 01 කට අඩු බැරකම් රු.43,773,226 ක් විය.

(ii) මු.රෙ. 94 (1) ප්‍රකාරව වෙනත් කිසිදු ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර, වාර්ෂික ඇස්තමේන්තු වලින් ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත්නම් මිස, වියදම් සඳහා බැදීම් ඇතිකර නොගත යුතු වුවත්, 2012 වර්ෂය තුල වැය විෂයයන් 14 කට අදාළව ප්‍රතිපාදන ඉක්මවා රු.26,382,325ක බැරකම් ඇතිකර ගෙන තිබුණි.

## 1.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළ යුතු ශේෂ**

ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වු තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | මාස 6 වැඩි වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 වැඩි | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| නිකුත්කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවු චෙක්පත් | 17,041 | 8,400 | 25,441 |

## 1.6 පාඩු හා හානි

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද හානි හා පාඩු ලේඛනය අනුව 2012 වර්ෂය තුළ රු.789,750 ක් වු හානි 12 ක් සිදුවී ඇති බව හෙළිදරව් කර තිබුණි. ඉන් රු.25,000 ඉක්ම වු හානි 08 ක් විසර්ජන ගිණුම තුළින් හෙළිදරව් කර නොතිබුණි. තවද මෙම හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 22 | - | 01 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියක මට්ටම | 66 | 44 | 22 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 73 | 60 | 13 | - |
| | **එකතුව** | 164 | 127 | 38 | 01 |

**1.8 ක්‍රීඩා වෛද්‍ය ආයතනය**
**-------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත නොකර ඖෂධ ගබඩාව සහ බෙහෙත් ශාලාව යන දෙකම ඖෂධ නිලධාරියා භාරව තිබුණු අතර, ඒ සඳහා එකම තොග පොතක් නඩත්තු කර තිබුණි. මෙම හේතුවෙන් ගබඩාවේ සහ බෙහෙත් ශාලාවේ තොග වෙන් වෙන්ව ගණනය කිරීමට නොහැකි විය. තවද ඖෂධ වර්ග 09 ක අතිරික්තයන් හා ඖෂධ වර්ග 04 ක ඌණතාවයන් දක්නට ලැබුණි.

(ii) 2012 වර්ෂයේදී ඖෂධ තොග සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර 2005 සැප්තැම්බර් සිට 2012 අප්‍රේල් මස දක්වා කාලපරිච්ඡේදය තුලදී කල් ඉකුත් වූ වටිනාකම් හඳුනාගත නොහැකි ඖෂධ වර්ග 102 ක් පැවති අතර ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) එක් එක් තරඟාවලිය සඳහා විශාල ප්‍රමාණයෙන් ඖෂධ නිකුත් කර තිබුණද ඒවා උපයෝජනය කළ ආකාරය හා ඉතිරි ඖෂධ පිළිබඳව විස්තර ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ජිම්නාස්ටික් ක්‍රීඩකයින් සඳහා විටින් විට ඖෂධ නිකුත් කර තිබුණු අතර නිකුත් කළ අවස්ථාවේදීම තොග පොතට ඇතුළත් නොකර මසකට නිකුත් කළ මුළු ප්‍රමාණය එකවරම තොග පොතට ඇතුලත් කර තිබුණි.

(v) අනුමත වෛද්‍ය නිලධාරි තනතුරු සංඛ්‍යාව 05 ක් වුවත්, වෛද්‍ය නිලධාරින් 03 දෙනෙකු අමතරව සේවයේ යොදවා තිබුණි. ඉන් දෙදෙනෙකු සඳහා 2013 ජනවාරි සිට මාස 04 ක කාලය සඳහා, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරවා ගැනීමේ පදනම මත ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ගෙවා තිබුණු රු.756,892 ක වැටුප ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(vi) භෞත චිකිත්සක තනතුරු 03 ක් අනුමත වී තිබුණද, තනතුරු 02 ක් සඳහා බඳවාගැනීම් සිදුකර නොතිබුණි.

(vii) වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පි තනතුර සඳහා බඳවා ගැනීම් කර නොතිබුණු අතර වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ බාහිර ආයතන වලින් සිදු කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**2. විසර්ජන ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------------------**

**2.1 විගණන විෂය පථය**
**--------------------**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.

සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 27 දින දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා

සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හෝ පොත් අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.5.10 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරික්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 802 | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. මෙය පසුගිය වර්ෂ වල වාර්තා වලින්ද පෙන්වා දී තිබුණි. |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 | ලේඛනය පිළියෙල කර නොතිබුණි. |
| (iii) | හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iv) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | බැරකම් ලේඛනයක් පවත්වා |

| | | | |
|---|---|---|---|
| | | | ගෙන ගොස් නොතිබුණි. |
| (v) | උප පත්‍රිකා පොත් ලැබීම් හා ඒ පිළිබඳ ක්‍රියාකාරකම් සටහන් කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 341 | ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (vi) | වැටුප් ලෙජරය | මුදල් රෙගුලාසි 445 | වැටුප් ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. |
| (vii) | වාහන ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645 | 267 වැනි පොදු ආකෘති පත්‍රය ප්‍රකාර ලොග් පොත් සම්පූර්ණ නොතිබුණි. |
| (viii) | පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය | මුදල් රෙගුලාසි 1647(අ) | ලොග් පොතෙහි සටහන් නොකරන්නා වූ පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම් සහ නිකුත් කිරීම් වෙනුවෙන් පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**(ආ) අයවැය විචලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

2012 වර්ෂයේ මුල් මාස 07 තුළ වැය විෂයයන් 10 ක් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 75 සිට සියයට 99 දක්වා ඉහළ ප්‍රතිශතයක්ද, වැය විෂයයන් 12 ක් වෙනුවෙන් වර්ෂය සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන මුදලින්, ජනවාරි සිට ජූලි දක්වා සියයට 25 ක් වැනි ඉතා පහළ අගයකින්ද වැයකර තිබුණි. මෙය 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන අයවැය චක්‍රලේඛ පරිදි දෙපාර්තමේන්තුව විසින් විධිමත්ව ඇස්තමේන්තු පිළියෙල නොකිරීමත්, මුදල් වර්ෂය ආරම්භ වීමට ප්‍රථම ප්‍රසම්පාදන සැලසුමක් සකස් නොකිරීමත් නිසා සිදුව ඇති බව නිරීක්ෂණය විය.

(i) වැය විෂයයන් 219-2-2-7-2104 යටතේ වෙන් කරන ලද රු.මිලියන 15 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි.

(ii) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් යෝජිත ඉතිරි කිරීම් ඇතුළත් වන පරිදි සකස් කල සංශෝධන ඇස්තමේන්තුව 2012 ජනවාරි 16 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු බව අවධාරණය කර තිබුණද සංශෝධිත ඇස්තමේන්තුව ඉදිරිපත් කිරිම 2012 අප්‍රේල් 26 දින දක්වාම ප්‍රමාද කර තිබුණි.

(iii) ශිර්ෂ 219 යටතේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට වෙන්කරන ලද ඇස්තමේන්තුවට අනුව වැය විෂයය 219-2-2-17-2104 යටතේ 2012 වර්ෂය සඳහා වෙන් කර තිබුණු රු.මිලියන 600 ක මුදලින් රු.මිලියන 157 ක් භාණ්ඩාගාර පූර්ව අනුමැතියකින් තොරව මු.රෙ.66 ට පටහැනිව ශිර්ෂ 136 යටතේ ඉදි කෙරෙමින් පවතින අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබා දී තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව "තත්කාර්ය" අතුරු අග්‍රිමය එක් අවස්ථාවකදී රු.20,000 කට නොවැඩි විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව රු.30,000 සිට රු.500,000 දක්වා වූ අතුරු අග්‍රිම ගෙවීම් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(ii) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කාර්යය නිම කල විගසම අත්තිකාරම් පියවිය යුතු වුවද එසේ සිදු නොකර දින 30 සිට දින 224 දක්වා ප්‍රමාද කර අත්තිකාරම් පියවා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(iii) නිලධාරින් තිදෙනෙකු විසින් රු.10,000 බැගින් අත්තිකාරම් ලබාගෙන අදාල කාර්යය ඉටු නොකර දින 09 ක්, 13 ක් සහ දින 14 ක් ප්‍රමාද කර ආපසු පියවා තිබුණි.

(iv) නිලධාරින් 10 දෙනෙකුට අවස්ථා 14 කදී අවශ්‍යතාවය ඉක්මවා අත්තිකාරම් ලබා දීම හේතුවෙන් වැය නොකර ඉතිරිවී තිබුණ සියයට 41 සිට සියයට 59 දක්වා මුදල් දින 5 සිට දින 34 දක්වා වූ කාලයක් අත රඳවා ගෙන තිබුණි.

(v) 2012 අප්‍රේල් සිට ජුලි දක්වා නිලධාරින් 27 දෙනෙකු විසින් ලබා ගන්නා ලද රු.422,500 ක් වූ අත්තිකාරම් වලින් රු.253,000 ක් දින 32 සිට 127 ක් දක්වා ප්‍රමාද කර පියවීම් කර තිබුණි.

(vi) නිලධාරීන් 14 දෙනෙකු විසින් කලින් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදල් ලබාගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. තවද කලින් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම දින 3 සිට දින 135 ක් දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(vii) එකතුව රු.974,000 ක් වූ අත්තිකාරම් මුදලක් නිලධාරින් 21 දෙනෙකුට ලබාදී තිබුණු අතර ඔවුන් විසින් දෙන ලද අත්තිකාරම් මුදල ඉක්මවා රු.852,550 ක් වියදම් දරා තිබුණි.

(viii) තත්කාර්ය අත්තිකාරම් වලට අදාල ලේඛනයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අත්තිකාරම් ගෙවීම් කරන ලද නිලධාරින්ගේ තනතුරු සඳහන් කර නොතිබුණි.

(ආ) ගෙවීම් වවුචර් අංක අත්තිකාරම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

(ඇ) අදාළ කාර්යය සිදුවන දිනය සඳහන් කර නොතිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අංක 6000/0000/00/0015/0100/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.125,967,532 ක් වු අතර, රු.13,909,113 ක් වු පොදු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) ගිණුමේ දක්වා ඇති පොදු තැන්පත් ගිණුමේ අවසන් ශේෂය සහ දෙපාර්තමේන්තු මාසික ගිණුම් සාරාංශ අතර රු.145,000 ක වෙනසක් පැවැතුණි.

(iii) මුදල් රෙගුලාසි 565(3) ප්‍රකාරව පොදු තැන්පත් සම්බන්ධයෙන් සැසඳීම් කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාරව එක් එක් මාසයක් වෙනුවෙන් පොදු ආකෘති 71 යටතේ පිළියෙල කරන ලද මාසික ගිණුම් සාරාංශයක් ඊළඟ මාසය අවසාන වීමට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද, එසේ කර නොතිබුණි.

(v) 2012 දෙසැම්බර් 31 දිනට තැන්පත් ලෙජරය තුලනය කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

1994 අගෝස්තු 18 දිනැති අංක 90 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව පිළියෙල කරන ලද කේවල ශේෂ වර්ගීකරණය සාරාංශයේ 3.1 ප්‍රකාරව පිළියෙල කරන ලද දෙපාර්තමේන්තු සේවයේ නියුතු නිලධාරින් 179 ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.23,937,141 ක ණය ශේෂ වලට අදාල සී.සී.10 ණය ලේඛන තුලනය කර නොතිබීම හේතුවෙන් එම නිලධාරින්ගේ කේවල ණය ශේෂයන් සැසඳිය නොහැකි විය.

## 2.4 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරික්ෂණ වලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවු අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| (i) | මුදල් රෙගුලාසි 177 | 54,940 | දෛනික ලැබීම් සියල්ල එදිනම හෝ හැකිතාක් ඉක්මනින් බැංකු ගත කල යුතු වුවද බැංකු ගත නොකර අත රදවාගෙන තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(අ) | 3,870,225 | නිලධාරින් 08 දෙනෙකුට අවස්ථා 32 කදී රු.30,000 සිට රු.50,000 දක්වා අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1646 | | 268 (අ) වැනි පොදු ආකෘතිපත්‍රය ප්‍රකාර මාසික සාරාංශ සමග දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත |

ඉදිරිපත් කර නොතිබුණ අතර 268 (අ) ආකෘතිය කිසිම වාහනයක් සම්බන්ධයෙන් සම්පූර්ණ කර නොතිබුණි.

**2.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**2.5.1 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන ඒකකයෙන්ද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**2.5.2 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ධාවනයෙන් ඉවත් කර දෙපාර්තමේන්තු රථගාලෙහි ගාල්කර තිබූ කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා 2012 ජුනි 26 දින රියදුරු විසින් ඉල්ලීමක් කර තිබුණද 2013 සැප්තැම්බර් 30 දක්වා කිසිඳු අලුත්වැඩියාවක් සිදු කර නොතිබුණි.

(ii) 2011 මාර්තු සිට ධාවනයෙන් ඉවත් කර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ අනාරක්ෂිත ලෙස මෝටර් කාරයක් ගාල් කර තිබීම හේතුවෙන් දිරාපත් වෙමින් තිබුණි.

(iii) තොග පොත් වලට ඇතුළත් නොකරන ලද එමෙන්ම මිලදී ගත් කාලය හා පිරිවැය හඳුනා ගත නොහැකි දැනට භාවිතයට නොගෙන අනාරක්ෂිතව ගාල් කර ඇති අත් ට්‍රැක්ටර් 08 ක් විය. ඒවා අපහරණය සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 සැප්තැම්බර් 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. මු.රෙ.756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 අප්‍රේල් 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණද දිස්ත්‍රික් ක්‍රීඩා මධ්‍යස්ථාන 6 ක් සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) 2012 වර්ෂයට අදාලව විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා හා ඌණතා සම්බන්ධයෙන් සහ භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) විධිමත් ලෙස පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් නොතිබුණි.**

**(ඇ) බේරුම් නොකල බැරකම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකල වසරකට අඩු බැරකම් ප්‍රමාණය රු.354,968,329 ක් විය.

(ii) මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් පරිදි ඇත්නම් මිස කිසිදු වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු නමුත් වැය විෂයයන් 24 කට අදාල ඉතිරිය ඉක්මවූ බැරකම් ප්‍රමාණය රු.40,435,690 ක් විය.

(iii) බැරකම් සම්බන්ධයෙන් 1994 ජුලි 12 දිනැති අංක 35/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3.3. ඡේදයට අනුව කටයුතු කර නොතිබුණි.

(iv) වැය විෂයයන් 4 කින් රු.119,856,000 ක් අවුරා තැබිය යුතු වුවත් 2012 වර්ෂය සඳහා රු.14,945,449 ක බැරකම් බැඳීම් ඇතිකර ගැනීම හේතුවෙන් අවුරා තැබීම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(v) විසර්ජන ගිණුමේ 2012 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් රු.354,964,697 ක බැරකම් බැඳීම් ඇතිකර ගෙන තිබුණි. වර්ෂයේ බැරකම් වශයෙන් රු.23,938,555 ක් පමණක් හෙළිදරව් කර තිබුණු අතර රු.331,026,142 ක බැරකම් හෙළිදරව් කර නොතිබුණි.

**2.5.3 කළමනාකරණයේ දුර්වලතා**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව සතු වෑන් රථයක් අමාත්‍ය මණ්ඩල වාහන සංචිතයට පවරා දී තිබුණු අතර 2012 වර්ෂය තුළදි දෙපාර්තමේන්තුව විසින් රු.119,309 ක අලුත්වැඩියා වියදමක් දරා තිබුණි. ඊට අමතරව මෝටර් කාරයක්ද අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත නිදහස් කර තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ක්‍රීඩා අමාත්‍යාංශය සතු වාහනයක් අයිතිය පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරමින් තිබුණි.

**2.5.4 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

**ගැලපුම් කල යුතු ශේෂ**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු හඳුනා නොගත් හර ශේෂය රු.80,161 ක් විය.

**2.5.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රීඩා ශක්ති වැඩසටහන, නේවාසික පුහුණු වැඩමුළු සහ වෙනත් විවිධ අවස්ථා වලදී ආහාර සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේදී වැය විෂයය 219-2-2-2-1405 න් රු.4,486,295 ක වියදමක් දරා තිබුණු අතර ආහාර සැපයීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. මෙහිදී ආයතන 03 කින් ලබා ගන්නා ලද මිල ගණන් අනුව නිවාස පාලකගේ නිර්දේශය මත පෞද්ගලික වෙළඳසැලකින් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබුණි. තවද පෙර වර්ෂ වලදී ද ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව එම වෙළඳසැලෙන්ම ආහාර ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

(ආ) 2008 අප්‍රේල් 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 431 ට පටහැනිව ක්‍රීඩා සංගම් විසින් රු.1,262,150 ක් වටිනා ගුවන් ප්‍රවේශපත්‍ර පුද්ගලික ආයතන වලින් මිලදී ගෙන එම මුදල් දෙපාර්තමේන්තුව වෙතින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ඇ) සුගතදාස ජාතික ක්‍රීඩා සංවර්ධන අධිකාරිය සඳහා විද්‍යුත් කාලගණක (Electronic Timing) පද්ධතියට අයත් උපකරණ 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් 2012 මැයි 22 දින රු.3,988,500 ක මුදලක් ගෙවා තිබුණි. අංක 219-1-1-1508 දරන පුනරාවර්තන වැය විෂයයේ ප්‍රතිපාදන මේ සඳහා භාවිතා කර තිබුණි. තවද මෙම උපකරණ දෙපාර්තමේන්තු පොත් වලට ඇතුළත් කර නොතිබුණු අතර උපකරණ සුගතදාස අධිකාරියට පැවරීමේදී විධිමත් ක්‍රියා පටිපාටියක් අනුගමනය කර නොතිබුණි.

(ඈ) මෙම මිලදී ගැනීම සඳහා 2012 මැයි 08 දිනැති අංක ක්‍රීසංදෙ/ගි/2/1 සුගතදාස දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත ඇගයීම් කමිටුවක් පත් කරගෙන තිබුණද එම කමිටුවට ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය පිළිබඳ දැනුම සහිත සාමාජිකයකු පත් කර නොතිබුණි. ඒ අනුව කමිටුව විසින් ගෙන තිබුණු තීරණ විගණනයේදී මත භේදයට තුඩු දෙන කරුණක් විය.

**2.5.6 අවිධිමත් ගණුදෙනු**

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් ජාතික මහ ක්‍රීඩා උළෙල අදියර III සහ IV සඳහා රු.556,907 ක් වැය කර සහතික පත්‍ර 45,070 ක් මුද්‍රණය කර තිබුණු අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) නාවලපිටිය ජයතිලක ක්‍රීඩාංගනයේ නේවාසිකාගාරයට අවශ්‍ය රු.373,317 ක් වටිනා උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. තවද අදාල භාණ්ඩ ගබඩාවට ලබා නොදී සෘජුවම එම ක්‍රීඩාංගනය වෙත ලබා දීම හේතුවෙන් තොග පොත් වලට ද ඇතුළත් කර නොතිබුණි. මෙම මිලදී ගැනීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් විසින් අනුමැතිය ලබා දී තිබුණි.

**(ආ) 2011 වර්ෂයේ සැප්තැම්බර් 8, 9 හා 10 දිනවල මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ පැවැත්වූ XXXVII වන ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා පදක්කම් සහ කුසලාන මිලදී ගැනීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතන 24 කින් මිල ගණන් කැඳවා තිබුණු බව සඳහන් වුවත් එම මිල විමසුම් සැපයුම්කරුවන්ට යැවූ බවට සාක්ෂි නොතිබුණි.

(ii) 2011 මැයි 27 පැවැත්වූ ටෙන්ඩර් මණ්ඩල තීරණයකට අනුව සැපයුම්කරුවන්ට එක් පදක්කමක් රු.1,000 බැගින් පදක්කම් 1,434 ක් රු.1,434,000 කට මිලදී ගැනීමට තීරණය කර ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 8.9.3 මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) 2011 වර්ෂයේ මැයි මස දින රහිත ඇණවුමක් සැපයුම්කරු වෙත යවා තිබුණු අතර පදක්කම් 2011 ජුනි 16 දිනට පෙර දෙපාර්තමේන්තුවට ලබා දිය යුතු බව සඳහන් කර තිබුණි. කෙසේ වුවද පදක්කම් 1,369 ක්ම ලැබී ඇත්තේ දින 02 සිට දින 24 ක් ප්‍රමාදයකින් බව නිරීක්ෂණය විය.

(iv) පදක්කම් 1,434 ක් ඇණවුම් කර තිබුණද පදක්කම් 1,409 ක් පමණක් ගබඩාවට ලැබී තිබුණු බව තවදුරටත් අනාවරණය විය.

**(ඇ) කුසලාන හා පදක්කම් සැපයීම**

XXXVIII ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා රු.1,133,100 ක් වටිනා පදක්කම් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(i) පදක්කම් මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තු ලියාපදිංචි සැපයුම්කරුවන් 10 දෙනෙකුගෙන් මිල ගණන් කැඳවූ බව සඳහන් කර තිබුණද සියලු ආයතන වෙත මිල විමසුම් යැවූ බවට සාක්ෂි නොවූ අතර ආයතන 03 කින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ඉන් ආයතන 02 කින් පමණක් සාම්පල් ඉදිරිපත් කර තිබුණි. තවද මිල ගණන් කැඳවීම් පත්‍රයේ භාණ්ඩ සති දෙකක් තුළ සැපයිය යුතුය යන්න කොන්දේසියක් ඇතුළත් කර තිබුණද ඇණවුම භාර දී තිබුණු ආයතනයට යවන ලද මිල කැඳවීම් පත්‍රයේ එවැනි කොන්දේසියක් අන්තර්ගත කර නොතිබුණි. ඒ අනුව සියළුම සැපයුම්කරුවන්ට සම අවස්ථාවක් ලබා දී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) රු.850 ට සහ රු.1,400 බැගින් එක් පදක්කමක් සැපයීම සඳහා ආයතන දෙකක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර, අඩු මිලට ටෙන්ඩරය ඉදිරිපත් කර ඇති ආයතනයේ සාම්පලය දෙපාර්තමේන්තුව විසින් දක්වන ලද පරිමාණයට අනුව ඉදිරිපත් කර ඇති නමුත් එහි නිමාව සහ පැහැය ක්‍රීඩා උළෙල සඳහා පිරිනැමීමට තරම් සුදුසු තත්ත්වයේ නොමැති බව හා රු.1,400 කට මිල ඉදිරිපත් කර ඇති ආයතනයේ සාම්පලය නියමිත පරිමාණයට හා තනි තහඩුවෙන් නිමවා කැටයම් කර ඇති බැවින් එහි නිමාවද හොඳ තත්ත්වයේ පවතින බව දක්වමින් එය මිල දී ගැනීම සුදුසු බවට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි.

(iii) ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් එම ආයතනය සමග කරන ලද සාකච්ඡාවට අනුව ඔවුන් රන් හා රිදී පදක්කමක් රු.650 බැගින් සහ ලෝකඩ පදක්කමක් රු.600 බැගින් ලබා දීමට එකඟ වන ලද බව ටෙන්ඩර් මණ්ඩල තීරණයෙහි සඳහන් කරමින් රු.903,300 ක මුදලකට පදක්කම් 1,429 ක් (රන් 258, රිදී 460, ලෝකඩ 511) මිලදී ගැනිමට 2012 මැයි 29 දින තීරණය කර තිබුණි. මෙලෙස අසාමාන්‍ය ලෙස සියයට 54 සිට සියයට 57 දක්වා ප්‍රමාණයක මිල අඩු කර සාම්පල් වලට අනුවම නිසි ප්‍රමිතියකින් එම මිලට භාණ්ඩ සැපයිය හැකිද යන්න පිළිබඳව ටෙන්ඩර් මණ්ඩලයේ අවධානයට යොමු නොකෙරුණි. 2012 ජුනි 08 දින පදක්කම් 1,429 ක් ඇණවුම් කර එය සති 02 ක් ඇතුලත සපයන ලෙස දන්වා තිබුණද ඒ අනුව පදක්කම් සපයා නොතිබුණි. මෙම අවස්ථාවේ මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන ලබා දී නොතිබුණි.

(iv) සපයා තිබූ පදක්කම් සාම්පල් සමග නොගැලපුණු අතර නිමාව සහ ගුණාත්මක භාවය දුර්වල විය.

(v) කුසලාන 54 මිලදී ගැනීම සඳහා රු.233,700 ක මිල ගණනක් ඉදිරිපත් කළ ඇණවුම වෙනුවට කුසලාන 54 ක් රු.229,800 ක සංශෝධිත මිල ගණන් වලට වෙනත් ආයතනයක් වෙතින් මිලදී ගැනීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කර තිබුණි. මේ සඳහා ටෙන්ඩර් මණ්ඩල තීරණයක් නොවීය.

(vi) කුසලාන 54 මිලදී ගැනීම සඳහා 2012 ජුනි 14 ඇණවුම් කර තිබුණද මින් කුසලාන 36 ක් 2012 ඔක්තෝබර් 31 දින දක්වාම සැපයුම්කරු විසින් ගබඩාවට බාර දී නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 8.9.3 අනුව සැපයුම්කරු සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ඔහුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද නොහැකි වී තිබුණි.

**2.5.7 අධිකාරි බලය නොමැති වූ ගණුදෙනු**

දෙපාර්තමේන්තු කායවර්ධන මධ්‍යස්ථානයේ ආදායම් ජාතික ක්‍රීඩා අරමුදලේ ගිණුමට බැර කරන අතර එසේ කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරය අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය.

**2.5.8 පාඩු හා හානි**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික මහා ක්‍රීඩා උළෙල අදියර IV සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නම සඳහන් කර සහතික පත් 1,820 ක් මුද්‍රණය කිරීම සඳහා රු.59,604 ක් වැයකර තිබුණු අතර ලේකම්වරයා

ස්ථාන මාරු වීම හේතුවෙන් එම සහතික පත්‍ර සම්පූර්ණයෙන්ම අවලංගු කර රු.45,944 ක් වැය කර සහතික පත් 1,485 ක් නැවත මුද්‍රණය කර තිබුණි. ඒ හේතුවෙන් අමාත්‍යාංශයට රු.59,604 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) 2011 ඔක්තෝබර් 21 දින සිට සේවයට වාර්තා කර නොතිබූ සේවකයෙකුට 2012 මැයි දක්වා ඔහුගේ වැටුප ලෙස රු.186,776 ක් ගෙවා තිබුණි.

### 2.5.9 අනාර්ථික ගණුදෙනු

රු.1,008,424 ක් වැය කර අලුත්වැඩියා කර 2012 මාර්තු 28 දින 2012 ජුලි 20 දිනෙන් පසුව වාහනයක් ධාවනයේ යොදවා නොමැති අතර සිදුකර තිබුණු මෙම අලුත්වැඩියාවෙන් අනතුරුව කි.මී.3,108 ක් පමණක් ධාවනය කිරීමෙන් පසුව මෙම වාහනය ධාවනයෙන් ඉවත් කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන කාර්යයක් බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.5.10 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 07 | 07 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 | - |
| (iii) | ද්විතියක මට්ටම | 198 | 163 | 35 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 104 | 76 | 29 | 12 |
| (v) | වෙනත් (අනියම් පදනම) | | 11 | | |
| | එකතුව | 321 | 259 | 74 | 12 |

(ආ) 2004 අප්‍රේල් 22 දිනැති අංක සීපීඡ්/පී1/40 දරන ජනාධිපති චක්‍රලේඛයට පටහැනිව දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්යාල කාර්ය සහායකයෙකු 2011 ජුනි මස සිට අමාත්‍ය කාර්ය මණ්ඩලයෙහි සේවය සඳහා මුදාහැර තිබුණු අතර අදාල කාලපරිච්ඡේදය තුළ ඔහුට වැටුප් හා දීමනා ලෙස රු.332,055 ක් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් දරා තිබුණි.

**3. ක්‍රීඩා සංගම්**

**3.1 ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය**

**3.1.1 ගිණුම් වර්ෂය - 2009**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අත්තිකාරම් දීමේදී දෙනු ලබන අත්තිකාරම් වෙනමම ගිණුමක සටහන් කර පියවන අවස්ථාවේදී අදාල වියදම ගිණුම්ගත කරනු වෙනුවට අත්තිකාරම් දෙන අවස්ථාවේදී සම්පූර්ණ මුදලම වියදම් ලෙස ගිණුම්ගත කර පියවන අවස්ථාවේදී ආපසු ගෙවූ මුදල් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. මෙලෙස අත්තිකාරම් 8 කට අදාලව රු.341,183 ක මුදලක් වැඩිපුර ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2009 දෙසැම්බර් 31 දිනට එකතුව රු.15,818,599 ක්වූ ශේෂ 12 කට අයත් වියදම් විස්තර, ලදුපත්, බිල්පත්, අනුමැතිය සහ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**3.1.2 ගිණුම් වර්ෂය - 2010**

2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.7,453,332 ක්වූ ගණුදෙනු 11 කට අයත් වියදම් විස්තර, ලදුපත්, බිල්පත්, අනුමැතිය සහ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**3.1.3 ගිණුම් වර්ෂය - 2011**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අවස්ථා 05 කට අයත් එකතුව රු.30,075,742 ක්වූ ගණුදෙනු 05 කට අයත් වියදම් විස්තර, ලදුපත්, බිල්පත් සහ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

(ආ) නෙදර්ලන්තයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වොලිබෝල් ක්‍රීඩා පිටි 05 ක් සඳහා වූ උපකරණ ඇතුළත් බහාලුම් 04 ක් වරායෙන් නිදහස් කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.2,673,759 ක් ගෙවා තිබුණි.

**3.2 ජාතික ඔලිම්පික් කමිටුව**

**3.2.1 ගිණුම් වර්ෂය - 2009**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 දෙසැම්බර් 31 දිනට එකතුව රු.198,414,361 ක්වූ ගණුදෙනු 06 කට අදාල වියදම් විස්තර, ලදුපත්, බිල්පත්, අනුමැතිය සහ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ආ) 2006 අංක 16 දරන දේශිය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව සේවකයන් දෙදෙනෙකුගෙන් උපයන විට ගෙවීම් බදු අයකර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට ජාතික ඔලිම්පික් කමිටුව විසින් කටයුතු කර නොතිබුණි.

**(ඇ) අධිකාරි බලයකින් තොර ගණුදෙනු**

---

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විධායක කමිටු අනුමැතියකින් තොරව වර්ෂය තුල බැංකු ජංගම ගිණුම් තුනක් විවෘත කර තිබුණි.

(ii) 2009 දෙසැම්බර් 31 දිනට සුළු මුදල් ශේෂය රු.127,109 ක්වූ අතර සුළු මුදල් අග්‍රිමයේ සීමාව සහ එක් ගණුදෙනුවකදී සුළු මුදලින් ගෙවිය හැකි උපරිම මුදල කොපමණද යන්න කලින් තීරණය කර නොතිබුණි.

**(ඈ) අවිධිමත් ගණුදෙනු**

---

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ජාතික ඔලිම්පික් කමිටුව සතු කායවර්ධන මධ්‍යස්ථානය රු.150,000 ක මාසික කුලියක් හෝ මාසික ආදායමින් සියයට 50 යන දෙකින් වැඩි අගය මත බාහිර ආයතනයකට කුලියට දී තිබූ අතර ලංසුකරු තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවා නොතිබුණි. තවද ලංසු පිරිනැමීම සඳහා විධායක කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ගිවිසුම් කාලය අවසන් වීමෙන් අනතුරුව එය දීර්ඝ කිරීමකින් තොරව මෙම ආයතනයට කායවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට ඉඩ ලබා දී තිබූ අතර 2010 අගෝස්තු 08 දින වන විට, මාස 06 කට අදාල රු.900,000 ක් වූ කුලී ආදායම හිඟව පැවතුණු අතර නොගෙවා තිබූ විදුලි ගාස්තු රු.464,056 ක් විය.

(ඉ) ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය නොකර රු.1,497,713 ක් වටිනා කාර්යාල උපකරණ හා රු.2,600,000 ක් වටිනා වාහනයක් වර්ෂය තුළ මිලදී ගෙන තිබුණි.

(ඊ) ජාතික ඔලිම්පික් කමිටුවට අයත් වර්ග අඩි 3,000 ක් පමණ වූ සම්පූර්ණ වායුසමනය කරන ලද ශක්ති වර්ධන පුහුණු මධ්‍යස්ථානයේ රථ ගාලක්, ආරක්ෂක සේවාවද සහිතව මසකට රු.150,000 ක් හෝ මාසික ආදායමින් සියයට 50 ක් යන දෙකෙන් වැඩි අගයකට මිල කැඳවීම් හා විධායක කමිටු අනුමැතියක් නොමැතිව තෝරා ගත් බදුකරුට බද්දට දී තිබුණි. තවද බදු කාලය 2008 නොවැම්බර් 10 දින සිට 2009 නොවැම්බර් 09 දින දක්වා කාලය සඳහා වූ අතර ඊට අදාල ගිවිසුම 2009 මැයි 05 දින තෙක් අත්සන් කර නොතිබුණි. තවද, ගිවිසුම් කාලය දීර්ඝ කිරීමකින් තොරව අදාල බදුකරුට තවදුරටත් අවස්ථාව ලබා දී තිබුණි.

**3.2.2 ගිණුම් වර්ෂය - 2010**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 16 වෙනි ආසියානු තරඟාවලියේ අලෙවිකරණ වැඩ සටහන සඳහා ඇමරිකානු ඩොලර් 30,000 ක (රු.3,317,487) මුදලක් ආසියානු ඔලිම්පික් කමිටුව මගින් ලබා දී තිබුණු අතර, 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය එලෙසම පැවතුණි.

(ආ) ආසියානු තරඟාවලියට සූදානම් වීමේ කටයුතු සඳහා ඔලිම්පික් සහෝදරත්වය මගින් ටෙනිස්, ගොල්ෆ් සහ වෙනත් ක්‍රීඩා සඳහා පිළිවෙලින් එ.ජ.ඩො. 20,545 ක් සහ එ.ජ.ඩො. 21,055 ක් ලබා දීමට එකඟ වී තිබූ අතර වර්ෂය තුලදී එයින් එ.ජ.ඩො. 50,000 ක් ඔලිම්පික් කමිටුව වෙත ලබා දී තිබුණි. කෙසේ වෙතත් ඔලිම්පික් කමිටුව විසින් ගොල්ෆ් සංගමය සහ ටෙනිස් සංගමය වෙත පිළිවෙලින් රු.මිලියන 1 සහ රු.මිලියන 2.5 ක් ලබා දී තිබුණි. අනිකුත් ක්‍රීඩා සඳහා ලබා දී තිබුණු අරමුදල් වලින් ඕස්ට්‍රේලියානු පුහුණුකරුවෙකුගේ ගාස්තු සහ Mental Toughness Training Programme හි වෙනත් වියදම් සඳහා පිළිවෙලින් රු.2,509,050 ක් සහ රු.623,009 ක් වැයකර තිබුණ බැව් විගණනයේදී නිරීක්ෂණය විය. පුහුණුකරු සමග අත්සන් කරන ලද ගිවිසුම විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඇ) දකුණු ආසියාතික තරඟ සඳහා පළාත් සභා වලින් සහ පුද්ගලික පාර්ශවයන් වෙතින් ලැබුණු පිළිවෙලින් රු.3,497,545 ක් සහ රු.451,856 ක් ලැබීම ගිණුමට බැර නොකර තරඟාවලි ගිණුමට බැර කර තිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.23,441,373 ක්වූ ගණුදෙනු 10 කට අදාල වියදම් විස්තර, ලදුපත්, බිල්පත්, අනුමැතිය සහ ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.

(ඉ) පහත දැක්වෙන නීතිරීති යනාදියට අනුකූල නොවීම අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීතිරීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (i) 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ හි 6.1.1 ජේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2011 වර්ෂයට අදාල වාර්තාව 2012 අගෝස්තු 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 මාර්ගෝපදේශය | ඔලිම්පික් කමිටුව විසින් 2010 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

(ඊ) එකතුව රු.51,723,086 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම් වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.14.1 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(උ) පිළිවෙලින් රු.100,000 ක් සහ රු.350,000 ක් වූ ක්‍රෙඩිට් පත් 02 ක් විධිමත් අනුමැතියකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණි. මේ සඳහා බැංකු ගිණුම් 02 ක් ද පවත්වාගෙන

ගොස් තිබුණු අතර ඒ සඳහා 2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.524,108 ක් සහ රු.373,989 ක් විය.

(ඒ) 2010 පොදු රාජ්‍ය මණ්ඩල තරඟාවලිය සඳහා අමාත්‍යාංශ මට්ටමින් සහභාගි වූ නිලධාරින් වෙනුවෙන් දරන ලද රු.760,339 ක වියදමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2010 වර්ෂය තුලදී ජාතික ඔලිම්පික් කමිටුව විසින් සුළු මුදල් වශයෙන් රු.1,266,434 ක් වැයකර තිබුණි. කෙසේ වෙතත්, සුළු මුදල් අග්‍රිමයේ සීමාව, දැරිය හැකි වියදම් වර්ග හා සීමාවන්, සුළු මුදල් ගෙවීම් සහ අග්‍රිමය පියවීම සඳහා ක්‍රමවේදයක් සහ සුළු මුදල් රෙජිස්ටරයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඕ) මිල කැඳවීම් සහ ගිවිසුම් අත්සන් නොකර වටිනාකම රු.2,103,000 ක් වූ ටී-ෂර්ට්ස් 1,650 ක් සහ ට්‍රැක් කිට්ස් 530 ක් මිලදී ගෙන තිබුණු අතර අවස්ථා 04 කදී කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ඉක්මවා සැපයුම්කරුවන්ට එකතුව රු.15,553,000 ක වූ අත්තිකාරම් ගෙවා තිබුණි.

(ක) 2011 වර්ෂයේදී ජාතික ඔලිම්පික් කමිටුවේ සේවකයින් 15 දෙනෙකු සේවය කල අතර ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි.

**3.2.3 ගිණුම් වර්ෂය - 2011**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තොරතුරු හුවමාරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අයවැය කරන ලද රු.405,000 මුදලක් ප්‍රාග්ධනිත නොකොට පුනරාවර්තන වියදමක් ලෙස කපාහැර තිබුණි.

(ආ) අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ජාතික ඔලිම්පික් කමිටුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රූඩ් 01 පර්චස් 20 ක ඉඩමක් 2010 වර්ෂයේදී වෙන්කර දී තිබුණද එය අගය කර 2011 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 18 හි 73 ඡේදය ප්‍රකාරව ඉදිරියට ගෙනා දළ වටිනාකම සහ සමුච්චිත ක්ෂය අවසන් ගිණුම් තුළ හෙළිදරව් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු.10,557,059 ක්වූ ගණුදෙනු 12 කට අදාල වියදම් විස්තර, ලදුපත්, බිල්පත් සහ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(ඉ) පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (i) | ජාතික ඔලිම්පික් කමිටු ව්‍යාවස්ථාවේ 13.3 ඡේදය | ව්‍යවස්ථාව ප්‍රකාරව වර්ෂයකට විධායක කමිටු රැස්වීම් 12 ක් පැවැත්විය යුතු වුවත් ජාතික ඔලිම්පික් කමිටුව විසින් 2011 |

| | | |
|---|---|---|
| | | වර්ෂයට අදාල රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ii) | ජාතික ඔලිම්පික් කමිටු ව්‍යවස්ථාවේ 14.5 (ආ) ජේදය | ව්‍යවස්ථාව ප්‍රකාරව, ජාතික ඔලිම්පික් කමිටුවේ භාණ්ඩාගාරික විසින් විදේශයන්ට යවන ලද ආදායම් හා වියදම් ප්‍රකාශ වලට අදාල පිටපතක් නඩත්තු කල යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (iii) | 2010 සැප්තැම්බර් 08 දිනැති සංශෝධිත ප්‍රසම්පාදන මගපෙන්වීම් 18 හි 5.4.4 ජේදය | කොන්ත්‍රාත්තු ආරම්භ කිරීම සඳහා දෙන ලද අත්තිකාරම් මුදල කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් නොඉක්මවිය යුතුය. කෙසේ වුවද එයට පටහැනිව අවස්ථා හතරකදී සීමාව ඉක්මවා එකතුව රු.589,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (iv) | 2008 අප්‍රේල් 28 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගුවන් ටිකට් පත් මිහින් ලංකා ආයතනයෙන් හෝ අනෙකුත් රාජ්‍ය ආයතන වලින් ගුවන් ටිකට් පත මිලදී ගතයුතු බව නියම කර තිබුණද ඊට පටහැනිව ජාතික ඔලිම්පික් කමිටුව විසින් රු.1,741,876 ක් වටිනා ගුවන් ටිකට් පත් පෞද්ගලික ආයතන වලින් මිලදී ගෙන තිබුණි. |

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 3.2.2 (අ) ප්‍රකාරව කටයුතු නොකොට ජාතික ඔලිම්පික් කමිටුව විසින් කලින් අයිතිකරුවන් තිදෙනෙකු විසින් වසර 05 ක පමණ කාලයක් භාවිතා කරන ලද ටොයොටා වෑන් රථයක් රු.2,600,000 කට 2008 වර්ෂයේදී මිලට ගෙන තිබුණි. එහි ගැණුම් ප්‍රතිෂ්ඨාව පියවා තිබුණේ ඔලිම්පික් ආයතනය සතුව පැවති කැරවෑන් වර්ගයේ වෑන් රථය වෘත්තීය තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් ලබා නොගෙන රු.1,400,000 කට අයිතිය පැවරීමෙන් සහ ප්‍රමාණවත් අරමුදල් ඉතිරි කිරීමේ ගිණුමක තිබියදී ඉතිරි රු.1,200,000 සඳහා කල්බදු මුල්‍ය පහසුකමක් ලබා ගැනීමෙනි. ඉහත වාහනය මිලදී ගැනීම සඳහා කල්බදු පහසුකමක් ලබා ගැනීම හේතුවෙන් ජාතික ඔලිම්පික් කමිටුව රු.455,113 ක පොලි වියදමක් දැරීමට සිදු වී තිබුණි.

(උ) 2009 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ජාතික ඔලිම්පික් කමිටුවේ ආපනශාලාව, වසර 05 ක කාලයක් සඳහා, පළමු වර්ෂය සඳහා මාසික බදු කුලිය ලෙස රු.300,000 ක් සහ ඉන් පසුව වාරිකය වාර්ෂිකව රු.30,000 බැගින් වැඩිවන පරිදි බදු දී තිබුණි. පසුව ඔලිම්පික් කමිටුව විසින් ඉහත ගිවිසුම අවලංගු කර 2009 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නව ගිවිසුමක් වෙනත් පාර්ශවයක් සමග පළමු වර්ෂය සඳහා මාසික බදු කුලිය රු.300,000 ක් සහ ඉන්පසුව වාරිකය වාර්ෂිකව රු.15,000 කින් වැඩි වන පරිදි නව ගිවිසුම අත්සන් කිරීම හේතුවෙන් ගිවිසුම් කාලයට අදාලව රු.2,700,000 ක ඇස්තමේන්තු ගත ආදායමක් අහිමි වී තිබුණි.

(ඌ) සාමාලෝචිත වර්ෂයේදී ජාත්‍යාන්තර ඔලිම්පික් කමිටුවෙන් ලද රු.1,350,000 ක අරමුදල් අදාල ක්‍රීඩා සංගම් වෙත ලබා නොදී ඔලිම්පික් කමිටුව විසින් රඳවා ගෙන තිබුණි.

(ඔ) විධායක කමිටු අනුමැතිය ලබා නොගෙන ඔලිම්පික් කමිටුවේ සේවකයන් 16 දෙනෙකුට රු.680,984 ක ප්‍රසාද මුදල් ගෙවා තිබුණි.

**3.3 ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය**

**3.3.1 ගිණුම් වර්ෂය - 2009**

2009 දෙසැම්බර් 31 දිනට එකතුව රු.403,789,846 ක්වූ ගණුදෙනු 10 කට අදාල තොග ලේඛනය, භෞතික සත්‍යාක්ෂණ වාර්තා, මිල කැඳවීම් විස්තර, අනුමැතිය සහ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවුයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.3.2 ගිණුම් වර්ෂය 2010**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්මේලනය සතු ආයෝජන වලට අදාල ආයෝජන ආදායමින් සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂ වලට අදාල පිරිවැටුම් බදු රු.1,097,620 ක් අඩු කර අදාල මූල්‍ය ආයතන විසින් දේශිය ආදායම් දෙපාර්මේන්තුවට ප්‍රේෂණය කර තිබුණු අතර එම මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.231,451,701 ක්වූ ගණුදෙනු 10 කට අදාල තොග ලේඛන, භාණ්ඩ ලැබීම් පත්‍ර, බිල්පත්, භාණ්ඩ බෙදාහැරීමේ විස්තර, මිල කැඳවීම් විස්තර සහ ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවුයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(ඇ) ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ආපනශාලාව 2007 වර්ෂයේදී බදු දී තිබුණු අතර මිල කැඳවීමකින් තොරව එම රේටයටම වසරින් වසර බදු කාලය දිර්ඝ කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී තරඟාවලි 27 ක් සඳහා නවාතැන්, ආහාර, ගමන් වියදම්, ක්‍රීඩා ඇඳුම් සහ ගුවන් ටිකට්පත් ආදිය සහ තරුණ වැඩසටහන් 07 ක් වෙනුවෙන් රු.48,141,933 වටිනා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගෙන තිබුණි.

(ඉ) රු.4,719,000 වටිනා කොන්ත්‍රාත් 02 දෙකක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණි.

(ඊ) ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මගින්, ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය වෙත ලැබෙන අරමුදල් කළමනාකරණය කර තිබුණේ, ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයේ ශ්‍රී ලංකා ශාඛාව මගිනි. මෙම ශාඛාවේ අරමුදල් භාවිතා කර ක්‍රියාත්මක කර සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති කිහිපයක්, සමාලෝචිත වර්ෂය තුලදී, ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය වෙත පවරා දී තිබූ අතර ඒවායේ වටිනාකම රු.25,850,000 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියට අදාල ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

**3.3.3 ගිණුම් වර්ෂය 2011**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,323,336 ක්වූ ගණුදෙනු 04 කට අදාල මිල කැඳවීම් විස්තර, භාණ්ඩලැබීම් හා බෙදා හැරීමේ විස්තර විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(ආ) අවස්ථා 27 කදී ලබාගෙන තිබූ අත්තිකාරම් වලින් ඉතිරි අත්තිකාරම් වූ රු.1,483,820 ක් අපේක්ෂිත කාර්ය නිම කිරීමෙන් අනතුරුව අදාල නිලධාරින් විසින් අත රඳවාගෙන දින 36 සිට දින 100 දක්වා ප්‍රමාදයන් සහිතව පියවා තිබුණි.

(ඇ) ක්‍රීඩා ඇඳුම් කට්ටල මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් වශයෙන් රු.355,950 ක් එනම් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 70 ක ප්‍රමාණයක් 2011 ජුනි 30 දින ගෙවා තිබුණද, අදාල ඇඳුම් පාපන්දු සම්මේලනය වෙත 2012 පෙබරවාරි දක්වා සපයා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ආපන ශාලාව මිල කැඳවීමකින් තොරව රු.45,000 ක මාසික කුලියට වසරක කාලයක් සඳහා 2006 වසරේදී බදු දී, වසරින් වසර ඉහත මුදලටම කොන්ත්‍රාත්තුව දිර්ඝ කර තිබුණි. ආපන ශාලාව සඳහා වෙනමම විදුලි මීටරයක් සහ ජල මීටරයක් සවිකර කර නොතිබුණු අතර 2011 වර්ෂයේ (කාර්යාලයද ඇතුළත්ව) සාමාන්‍ය මාසික විදුලි සහ ජල බිල්පත් ගාස්තුව පිළිවෙලින් රු.190,286 ක් සහ රු.16,584 ක් විය.

(ඉ) සම්මේලනයේ කාර්ය මණ්ඩලය සඳහා ණය යෝජනා ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු අතර ක්‍රීඩකයකුට සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයකුට පිළිවෙලින් රු.470,000 ක් සහ රු.15,000 ක ණය ලබාදී තිබුණි. එහෙත් අදාල පාර්ශවයන්ගෙන් ණය මුදල් අයකර ගැනීමට කිසිඳු ක්‍රියා මාර්ගයක් නොගෙන පොත් වලින් ලියා හැර තිබුණි.

(ඊ) 2011 වර්ෂයේදී ඉරානයේ පැවති AFC-U-13 පිරිමි තරඟාවලියට නිලධාරින් 05 දෙනෙකු ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව සහභාගි කරවා තිබුණි.

(උ) නියමිත කාලයට භාවිතයට නොගැනීම හේතුවෙන් කල් ඉකුත් වූ වටිනාකම රු.157,063 ක් වූ පාපන්දු 341 ක් පොත් වලින් ලියා හැර තිබුණි.

**3.4 ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමය**

**3.4.1 ගිණුම් වර්ෂය - 2010**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර රග්බි සංගමයෙන් ලද රු.60,000 ක මුදලක් වර්ෂය තුලදී ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන රු.4,115,733 ක ණය ගැති ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.4,551,814 ක්වූ ගණුදෙනු 04 කට අදාල තොග ලේඛන හා භෞතික සමීක්ෂණ වාර්තා, බිල්පත්, භාණ්ඩ නිකුත් කිරීම් විස්තර සහ ස්ථාවර වත්කම්

ලේඛනය හා භෞතික සමීක්ෂණ විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

### 3.4.2 ගිණුම් වර්ෂය - 2011

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මිණි රග්බි සැණකෙළිය සඳහා ආහාර සැපයීම වෙනුවෙන් බාහිර පාර්ශවයක් වෙත රු.910,612 ක් ගෙවා තිබුණි. පසුව මිණි රග්බි සැණකෙළියේ සත්‍ය වියදම ඇස්තමේන්තු මුදල ඉක්මවීම වැළැක්වීම සඳහා, මිණි රග්බි සැණකෙළියේ වියදම් ජර්නල් සටහනක් මගින් සංවර්ධන වියදම් යටතට මාරු කර තිබුණි.

(ආ) පහත දැක්වෙන ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.1,173,560 ක පිරිවැටුම් බදු මුදල්.

(ii) ජාත්‍යන්තර රග්බි සංගමයෙන් 2009 වර්ෂයේ සිට ලැබිය යුතු රු.7,586,000 ක මුදල්.

(iii) 2011 මැයි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ප්‍රාදේශීය රග්බි සංගම් වලින් ලැබිය යුතු එකතුව රු.300,050 ක අත්තිකාරම් මුදල්.

(iv) වෙනත් ණය ගැතියෝ යටතේ දක්වා ඇති වසර 01 ත් 04 ත් අතර පැරණි රු.22,348,013 ක හිඟ ශේෂ.

(ඇ) 2010 වර්ෂයේ සිට රුහුණු රග්බි සංගමයෙන් ලැබිය යුතු රු.140,000 ක මුදලක් මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී මෙම ශේෂය සංවර්ධන වියදම් වලට මාරු කර තිබුණි.

(ඈ) තරඟකාරි මිල ගණන් කැඳවීමකින් තොරව රු.681,302 ක් වටිනා භාණ්ඩ හා සේවා ලබාගෙන තිබුණි.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු.47,721,166 ක්වූ ගණුදෙනු 04 කට අදාල මිල කැඳවීම්, ශේෂ සනාථන ලිපි, අනුමැතිය, ඇස්තමේන්තු, සහ තොග ලැබීම් හා නිකුත් කිරීම් විස්තර විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(ඊ) පිළිවෙලින් රු.231,630 ක් සහ රු.924,890 ක් වූ කාර්යාල උපකරණ සහ ක්‍රීඩා උපකරණ තොගයක් තරඟකාරි මිල ගණන් කැඳවීමකින් තොරව මිලදී ගෙන තිබුණි.

(උ) 2008 අප්‍රේල් 28 දිනැති අංක 431 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට පටහැනිව රු.1,008,392 ක් වටිනා ගුවන් ටිකට් පත් පෞද්ගලික සමාගමකින් මිලදී ගෙන තිබුණි.

(ඌ ) පිරිවැය රු.177,723 ක් වූ පරිගණක මෘදුකාංග පැකේජයක් බාහිර පුද්ගලයෙක්ගෙන් මිලදී ගෙන තිබුණු අතර එම පැකේජය භාවිතා කිරීම සඳහා ලැප්ටොප් පරිගණකයක්ද මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා තරඟකාරී මිල කැඳවීම් කර නොතිබුණි.

(එ) රග්බි සංගමයට විරුද්ධව උසාවියේ පනවා ඇති නඩුවකට අදාලව නීතිමය වියදම් වෙනුවෙන් රු.518,124 ක් ගෙවා තිබුණු අතර සංගමය විසින් එම නඩුව පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) විදේශ සහ දේශීය පුහුණුකරුවන්ට රු.1,527,875 ක් ගාස්තු වශයෙන් ගෙවා තිබුණද ඔවුන්ගේ පත්වීම් ලිපි සහ ඔවුන් සමග අත්සන් කරන ලද ගිවිසුම් විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

## 3.5 ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය - ගිණුම් වර්ෂය 2012

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී දේපල පිරියත හා උපකරණ නැවත ඇගයීම් කර තිබුණද, එසේ කිරීමට හේතු විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඈ) වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු.4,446,424 ක් වූ ක්‍රීඩා භාණ්ඩ සහ රු.1,690,071 ක්වූ මිණුම් උපකරණ තොගයක් පුනරාවර්තන වියදම් යටතේ ලියා හැර තිබුණි.

(ඉ) වසර තුනක සිට පැවත එන රු.මිලියන 09 ක් වූ ජංගම ගිණුම් ශේෂයක් මෙම වසරේදී ද ඵලදායී ආයෝජනයක යොදවා නොතිබුණි.

(ඊ) පසුගිය වර්ෂ කිහිපයක සිට පැවත එන එකතුව රු.429,016 ක අත්තිකාරම් 2012 දෙසැම්බර් 31 දින දක්වා පියවා නොතිබුණි.

## 3.6 ශ්‍රී ලංකා පැසිපන්දු සංගමය - ගිණුම් වර්ෂය 2012

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංගමය හා පුහුණුකරු අතර ගිවිසුමක් නොමැතිව, සංගමය විසින් විදේශ පුහුණුකරුගේ වියදම් සඳහා රු.412,923 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) 12 වන දකුණු ආසියාතික තරඟාවලියට සුදුසුකම් ලැබූ පුහුණු සංචිතයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණුවීම් සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංගමය වෙත ලබා දී තිබූ රු.300,000 ක මුදලක් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව විදේශීය පුහුණුකරුගේ වියදම් සඳහා වැය කර තිබුණි.

**3.7 ආධුනික රුවල් ඔරු සංගමය - ගිණුම් වර්ෂය 2012**

සංගමයට අයත් රුවල් ඔරු 103 ක්, රුවල් බෝට්ටු 16 ක් ගිණුම් වලට ගෙන නොතිබුණු අතර 2012 වර්ෂය තුල රුවල් බෝට්ටු 16 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.823,275 ක් වැයකර තිබුණි.

**3.8 ආධුනික රුවල් ඔරු සංගමය - ගිණුම් වර්ෂය 2012**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංගමය විසින් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් රු.18,968,844 ක දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 19 ප්‍රකාරව සේවක පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඇ) සංගමය විසින් 1958 දී අවුරුදු 25 ක් සඳහා කල් බදු පදනම මත කොළඹ මහ නගර සභාවෙන් ලබාගෙන තිබූ ඉඩමට අදාල කල්බදු ගිවිසුම 1983 සැප්තැම්බර් 30 දිනෙන් අවසන්ව තිබුණද අදාල ගිවිසුම අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද රු.13,995,200 ක කල්බදු වාරික සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබීම හේතුවෙන් එදිනට මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු තොගයේ වටිනාකම සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

**3.9 බර ඉසිලීමේ සංගමය ගිණුම් වර්ෂය 2012**

බර ඉසීලිමේ උපකරණ මිලදී ගැනීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංගමයට ලබා දී තිබුණු රු.1,500,000 ක මුදලින් රු.1,411,200 ක මුදලක් වැය කර ක්‍රීඩා උපකරණ මිලදී ගෙන තිබුණද, ඉතිරි රු.88,800 ක මුදල ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට ආපසු ලබා දී නොතිබුණි.

**3.10 බිලියඩ් සහ ස්නූකර් සංගමය - ගිණුම් වර්ෂය 2012**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේදී දේපල පිරියත හා උපකරණ නැවත ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර එම වාර්තාව විගණනයට ඉදිරිපත් නොවීය. එම නිසා ප්‍රත්‍යාගණන ක්‍රියාවලියේ සහ ගිණුම් ගත කිරීම් වල නිවැරදි බව, හා සම්පූර්ණත්වය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් කර නොතිබු බැවින් ඒවායේ භෞතික පැවැත්ම සම්බන්ධයෙන් විගණනයේදී තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය.

(ඈ) සංගමය විසින් වත්කම් ලැබුණු දිනය හෝ වත්කම් මිලදී ගත් දිනයන් සහිතව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ක්ෂය වෙන් කිරීමේ නිවැරදි භාවය හා සම්පූර්ණත්වය පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

**3.11 ජාතික රයිෆල් සංගමය - ගිණුම් වර්ෂය 2012**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීම් කර නොතිබුණි.

(ආ) රු.4,369,317 ක් වටිනා ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

(ඇ) වසර 02 ඉක්මවූ රු.434,289 ක් වූ ණයගැති ශේෂයන් වෙනුවෙන් බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) වසර 03 ක් ඉක්මවූ රු.728,341 ක ණය හිමි ශේෂයන් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,399,634 ක්වූ ගණුදෙනු 04 කට අදාල තොග සමීක්ෂණ වාර්තා, තොග ලෙජරය සහ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.

**3.12 ශ්‍රී ලංකා අශ්වාරෝහක සංගමය - ගිණුම් වර්ෂය 2012**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්කවුට් ගාස්තු වශයෙන් ලද රු.90,000 ක මුදල රු.20,000 ක් ලෙස ලෙජරයේ සටහන් කර තිබුණි.

(ආ) 2012 වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,558,296 ක්වූ ගණුදෙනු 04 කට අදාල අශ්වයන් මියගිය බව තහවුරු කිරීමට අදාල ලියකියවිලි, ප්‍රදානයන්, සඳහා අනුමැතිය සහ ශේෂ සනාථ කිරීම විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

(ඈ) සංගමය විසින් 2012 වර්ෂය සඳහා අයවැයක් පිළියෙල කර නොතිබුණි.

**3.13 ශ්‍රී ලංකා ක්‍රිකට් - ගිණුම් වර්ෂය 2012**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 2.5.1.2 අනුව, ආදායම් ප්‍රකාශනයේ තරඟාවලි ආදායම හඳුනා ගැනීමේ ප්‍රතිපත්තිය එම තරඟාවලි නිමකිරීමේ කාලපරිච්ඡේදය සඳහා වේ. කෙසේ වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එයට පටහැනිව, ඉකුත් වර්ෂවල එකතුව රු.46,017,086 ක් වූ ශ්‍රී ලංකා ක්‍රිකට් තරඟාවලි පාඩු සමාලෝචිත වර්ෂයේ ආදායමට ලියාහැර තිබුණි.

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් එහි ආරම්භයේ සිටම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, 2012 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් පිරිවැය රු.8,985,468,081 ක් විය. තවද කළමනාකරණය විසින් දැනටත් භාවිතා කරන සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2012 වර්ෂය තුළදී රු. 4,282,971,011 ක්, රු.1,243,418,241 ක් හා රු.1,657,258,697 ක්වූ පිළිවෙලින් අභිනවයෙන් ඉදිකරන ලද සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණයේ වටිනාකම, පල්ලේකැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ නවීකරණ පිරිවැය, ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය බඳුදීමේ වටිනාකම සහ 2012 වර්ෂය තුළදී දරන ලද රු.2,774,076 ක්, රු.4,793,215 ක් හා රු.54,686,368 ක්වූ පිළිවෙලින් සූරියවැව, පල්ලේකැලේ හා ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනවල අතිරේක වැඩ සඳහා දරන ලද පිරිවැය ප්‍රාග්ධනිත කර තිබුණද, 2011 හා 2012 වර්ෂ සඳහා ගිණුම්වල ක්ෂය ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(iii) 2009 වර්ෂයේ සිට ගිණුම්වල දැක්වෙන රු.33,804,033 ක් හා රු.1,347,789 ක්වූ වෙලගෙදර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ හා මොරටුව ක්‍රිකට් ක්‍රීඩාංගණයේ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(iv) පල්ලේකැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ, ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනයේ හා ගාල්ල ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂය තුළදී සම්පූර්ණ කර තිබුණද, ඒ සඳහා දරන ලද එකතුව රු.16,027,367 ක් වූ පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. තවද එම මුදලින් රු.4,920,510 ක් වූ මුදලක් ඉදිකිරීම් අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් 2011 අප්‍රේල් මාසයේදී විදුලි ජනක යන්ත්‍ර කුලියට ගැනීම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයට රු.72,066,353 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි. එම වටිනාකමින් යුත් විදුලි ජනක යන්ත්‍ර දෙකක් ආපසු භාරදීමෙන් හිඟ ශේෂයන් රු.61,790,680 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් මඟින් නිරවුල් කර තිබුණි. කෙසේ වුවද විදුලි ජනක යන්ත්‍ර වටිනාකම ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබුණි.

(vi) බැරපත් ( Credit Card ) මඟින් නිරවුල් කරන ලද රු.364,153 ක් වූ පෞද්ගලික වියදම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගනු වෙනුවට සාවද්‍යව ආදායමට කපාහැර තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂය තුළ පැවති එංගලන්ත ශ්‍රී ලංකා ක්‍රිකට් සංචාරයේදී ගාලු ක්‍රිකට් සමාජයෙන් අය විය යුතු ප්‍රවේශපත් විකිණුම් ආදායම රු.702,525 ක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගිණුම් වලට ගෙන නොතිබුණු අතර හිඟ ශේෂය අයකර ගැනීමට 2013 පෙබරවාරි 20 වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ඈ) පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන ආදායම හා ජාතිය ගොඩනැගීමේ බදු සඳහා හෙළිදරව් කරන ලද ආදායම අතර රු.4,744,610 ක වෙනසක් පැවති බව අනාවරණය විය.

(ii) තරඟාවලි අත්තිකාරම් ලෙජර ශේෂය හා උපලේඛන ශේෂ අතර රු.452,785 ක්වූ වෙනසක් නිරීක්ෂණය විය.

**(ඇ) අවිනිශ්චිත ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුම් ශේෂය රු.286,193 ක් විය. කෙසේ වුවද මෙම ශේෂය ඇතිවී තිබුණේ රු.4,185,008 ක් වූ හඳුනා නොගත් හර කිරීම් හා රු.4,471,201 ක් වූ හඳුනා නොගත් බැර කිරීම්වලින් පසුවය.

**(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිමැවුම් බදු වලට එරෙහිව අඩුකළ නොහැකි යෙදවුම් බදු මත ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම හේතුවෙන් ලැබිය යුතු ලෙස ඉදිරි වර්ෂ සඳහා ඉදිරියට ගෙන ඒමට නොහැකිවී තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස දැක්වෙන රු.3,454,092 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) අයකර ගැනීමේ හැකියාව සැක සහිතය.

(ii) 1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධිත) පනතේ 06 වගන්තිය ප්‍රකාරව නොවිකුණන ලද ප්‍රවේශපත් මත ගෙවන ලද විනෝද බදු, තරඟාවලිය පවත්වා දින 30 ක් ඇතුළත අයකර ගත යුතුය. කෙසේ වුවද නොවිකුණන ලද ප්‍රවේශපත් මත පළාත් පාලන ආයතනවලට ගෙවන ලද විනෝද බදු මුදල් රු.13,152,146 කට අදාල ඉල්ලීම් නිශ්චිත කාලය තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අයකර ගැනීම සැකසහිතය.

(iii) 2012 දෙසැම්බර් 31 දිනට රු.25,624,201 ක් වූ මුළු හිඟ ඉදිකිරීම් අත්තිකාරම්වලින් වර්ෂයකට වැඩි හිඟ අත්තිකාරම් රු.19,401,697 ක් විය. කෙසේ වුවද මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට ශ්‍රී ලංකා ක්රිකට් කටයුතු කර නොතිබුණි.

(iv) 2012 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ තරඟාවලි අත්තිකාරම් සහ වෙනත් අත්තිකාරම් රු.46,945,084 කින් හා රු.11,888,139 කින් වර්ෂයකට වැඩි හිඟ අත්තිකාරම් පිළිවෙලින් රු.42,861,949 ක් හා රු.8,352,209 ක් විය. කෙසේ වුවද හිඟ අත්තිකාරම් අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් කටයුතු කර නොතිබුණි.

(v) එකතුව රු.3,071,704 ක් වූ වෙනත් ණයගැතියන් වර්ෂ එකේ සිට හතර දක්වා කාලයක සිට හිඟ හිට පැවතියද, හිඟ ණය අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් කටයුතු කර නොතිබුණි.

(vi) විදේශීය ක්‍රිකට් පාලක මණ්ඩල වලින් හා අනුග්‍රාහකත්ව මුදල් වලින් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු.20,481,888 ක් හා රු.39,016,026 ක් වුවද, වර්ෂ එකේ සිට හතරක කාලයක් හිඟ හිට පැවති ශේෂ පිළිවෙලින් රු.19,362,587 ක් හා රු.13,167,589 ක් විය.

(vii) 2012 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩකයන්ට ගෙවිය යුතු රු.23,353,656 ක් වූ තරඟ ගාස්තුවලින් වර්ෂ තුනේ සිට පහ දක්වා කාලයක් පරිශේෂව තිබූ ගාස්තු ප්‍රමාණය රු.403,628 ක් විය. කෙසේ වුවද 2013 මාර්තු 31 දක්වා එම ශේෂ නිරවුල් කිරීමට හෝ පැහැදිලි කර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් කටයුතු කර නොතිබුණි.

(viii) 2012 දෙසැම්බර් 31 දිනට රු.65,650,372 ක් වූ ගෙවියයුතු මුළු වෙළඳ ශේෂයෙන් වර්ෂ එකේ සිට හතර දක්වා කාලයක් හිඟ හිටි ශේෂයන් රු.56,862,411 ක් විය.

(ix) 2012 දෙසැම්බර් 31 දිනට රු.33,873,499 ක් වූ ගෙවිය යුතු මුළු අනුග්‍රාහකත්ව මුදල් වලින් වර්ෂ එකේ සිට පහ දක්වා කාලයක් පරිශේෂව පැවති ශේෂය රු.1,319,018 ක් විය.

(x) ප්‍රධාන විධායක නිලධාරින්ගේ 2011 ඔක්තෝබර් 17 දිනැති ලිපිය ප්‍රකාරව, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට ගෙවිය යුතු මුදල රු.25,753,845 ක් විය. කෙසේ වුවද එම මුදල ගිණුම්වලට ගෙන නොතිබුණි.

(xi) ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබිය යුතු මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව රු.74,901,760, ක් හා රු.242,465,738 ක් වූ ලැබිය යුතු මුදල් විධායක කමිටුවේ නිර්දේශය මත 2011 හා 2012 වර්ෂවලදී බොල් ණය ලෙස ලියාහැර තිබුණි.

**(ඊ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

2012 දෙසැම්බර් 31 දිනට අවස්ථා 06 කට අයත් එකතු වටිනාකම රු.20,188,735,106 ක්වූ ගණුදෙනු සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, වත්කම් භෞතික සත්‍යාපන වාර්තා, විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුයෙන් එම ශේෂ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

**(උ) නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂය තුළ විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 23 වගන්තිය | ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එකතු කළ අගය මත බදු උපචිත පදනම වෙනුවට මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 1985 අංක 01 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධිත) පනතේ 9(2) වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 17(1) වගන්තිය | පනත්වල දක්වා ඇති මුළු ඉපැයීම් වෙනුවට සේවකයින්ගේ මූලික වැටුප මත ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සේවක අර්ථ සාධක අරමුදලට දායකය හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කර තිබුණි. |
| (iii) | 2006 ජනවාරි 25 දිනැති අංක එන්පීඒ 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ චක්‍රලේඛය - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය. | සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රසම්පාදනයන් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. |

**(ඌ) ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සුළු මුදල් අග්‍රිම සීමාවන් නියම කිරීමෙන් තොරව හා අනුමැතියකින් තොරව විවිධ පාර්ශවයන්ට රු.5,000 සිට රු.250,000 දක්වා වූ සුළු මුදල් අත්තිකාරම් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ලබාදී තිබුණි. තවද, අත්තිකාරම් ලේඛනයක් නොපැවැත්වීම හේතුවෙන් අත්තිකාරම් නිරවුල් කිරීම පිළිබඳව විගණනයේදී පරික්ෂා කිරීමට නොහැකි විය.

**(එ) ජාතික කණ්ඩායමේ ඇඳුම් සැපයීමේ අනුග්‍රාහකත්ව කොන්ත්‍රාත් ආදායම - වර්ෂ 2009 සිට 2012 දක්වා.**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009 අප්‍රේල් 30 දින ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ජාතික කණ්ඩායම හා ඇඳුම් අනුග්‍රාහක සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ 4.1 වගන්තිය අනුව, නියමිත දිනයන්හි හිමිකම්භාග ගාස්තු (Royalty Fees) රැස්කර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අනුග්‍රාහක විසින් රු.7,403,500 ක් හා රු.9,328,750 ක් වූ ගෙවීම් පිළිවෙලින් දින 23 කින් හා දින 60 කින් ප්‍රමාද කර තිබුණි.

(ii) ඉහත ගිවිසුමේ 4.2 වගන්තිය අනුව, අනුග්‍රාහක විසින් අනුරූ ඇඳුම් විකුණුම් (Replica Clothing Sales) මත සියයට 15 ක් එක් එක් කාර්තුව සම්පූර්ණ වීමෙන් පසු දින 14 ක් ඇතුළත ගෙවීම අවශ්‍ය වේ. කෙසේ වුවද 2009 ජුනි 30 සිට 2011 ජුනි 30 දක්වා කාලපරිච්ඡේදයට අදාල ඉන්වොයිසි නිකුත් කර තිබුණේ 2011 සැප්තැම්බර් 23 දිනදීය. ඒ අනුව එකතුව රු.4,179,158 ක් වූ ලැබිය යුතු මුදල් දින 286 සිට දින 1016 ක් වූ ප්‍රමාදයන් සහිතව අනුග්‍රාහක විසින් නිරවුල් කර තිබුණි. තවද ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් 2011 අවසාන කාර්තු දෙක සඳහා සහ 2012 පළමු කාර්තුව සඳහා ඉන්වොයිසි 2013 මාර්තු 31 වන විටත් නිකුත් කර නොතිබුණි.

**(ඒ) ජාතික කණ්ඩායමේ ඇඳුම් සැපයීමේ අනුග්‍රාහකත්ව කොන්ත්‍රාත්තුව - වර්ෂ 2012 සිට 2015 දක්වා.**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ මාර්ගෝපදේශ 3.1.4 ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම අවශ්‍ය වුවද ඉහත කොන්ත්‍රාත්තුවට අදාලව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා 2012 පෙබරවාරි 05 දින ලංසු කැඳවීමේදී එසේ කටයුතු කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ මාර්ගෝපදේශ 6.2.2 ප්‍රකාරව ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක්ද ලබාදී නොතිබුණු අතර එක් ලංසුවක් පමණක් ලැබී තිබුණි.

(ii) අනුග්‍රාහක විසින් වර්ෂ තුනක කාලයක් සඳහා එ.ජ.ඩො 230,000 ක මුදලක් ගෙවීමට එකඟවී තිබුණු අතර ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් සමාගම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කළ උපදේශක ආයතනයට ගාස්තු වලින් සියයට 10 ක් ගෙවීමට එකඟ වී තිබුණි. 2012 ජූනි දක්වාම ගිවිසුමක් අත්සන් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් අපොහොසත් වී තිබුණි. තවද ලංසු කැඳවීමේදී ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ලංසු ඇපකරය හා බැංකු ඇපකරය ලබාගෙන නොතිබුණි. පසුව අනුග්‍රාහක විසින් 2012 ජූනි 21 දින ලංසුව ඒකපාර්ශවිකව අවලංගු කර තිබුණි.

(iii) මුල්‍ය ප්‍රධානී විසින් රිබොක් අමතර ප්‍රදර්ශන ("Branding Exposure for Reebok on Player Clothing ") සඳහා 2012 අගෝස්තු 21 දින නිකුත් කරන ලද එ.ජ.ඩො 44,166.66 ක් වටිනා ඉන්වොයිසිය අලෙවිකරණ ප්‍රධානී විසින් 2012 දෙසැම්බර් 21 දින දෙන ලද උපදෙස් ප්‍රකාරව මුල්‍ය ප්‍රධානී විසින් අවලංගු කර තිබුණු අතර මුල්‍ය ප්‍රධානී විසින් 2012 දෙසැම්බර් 21 දින එ.ජ.ඩො 19,166.66 කට නව ඉන්වොයිසියක් නිකුත් කර තිබුණි. කෙසේ වුවද මුල් ඉන්වොයිසිය අවලංගු කිරීමටත් නව ඉන්වොයිසියක් නිකුත් කිරීමටත් හේතුවූ පිළිගත හැකි කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) 2012 අප්‍රේල් 01 සිට 2012 ජූලි 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා අමතර සන්නම් ප්‍රදර්ශන ("Additional Branding Exposure") වශයෙන් රු.2,383,566 ක මුදලක් ගෙවීමට ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අනුග්‍රාහකගෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද අනුග්‍රාහක විසින් 2013 පෙබරවාරි 20 වන විටත් ගෙවීම් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අතිරේක ගෙවීම් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඔ) ජාතික කණ්ඩායමට ඇඳුම් සැපයීමේ අනුග්‍රාහකත්ව කොන්ත්‍රාත්තුව සඳහා නැවත ලංසු කැඳවීම වර්ෂ 2012 සිට 2015 දක්වා.**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 අගෝස්තු 01 දින සිට ආරම්භවන වර්ෂ තුනක කාලපරිච්ඡේදය සඳහා ජාතික කණ්ඩායමේ අනුග්‍රාහකත්වය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් 2012 ජූනි 24 දින නැවත ලංසු කැඳවා තිබුණු අතර ලංසු කැඳවීම අවසන් කළ දිනය 2012 ජූලි 04 දින විය. ඒ අනුව 2012 ජූලි 04 දින ලංසු දෙකක් ලැබී තිබුණි. කෙසේ වුවද, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 3.1.4 ප්‍රකාරව ජාතික කණ්ඩායම් ඇඳුම් සැපයීමේ අනුග්‍රාහකත්වය සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමට ශ්‍රී ලංකා ක්‍රිකට් අපොහොසත් වී තිබුණි.

(ii) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාගැනීමෙන් තොරව 2012 අගෝස්තු 01 දිනෙන් ආරම්භවන වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් සඳහා ඉහළ ලංසුව ඉදිරිපත් කර

තිබුණු ලංසුකරුට රු.63,000,000 කට ලංසුව ප්‍රදානය කර තිබුණි. මෙම මිල තුළ රු.50,000,000 ක් වු ඇඳුම් සහ රු.13,000,000 ක් වටිනා රාජ්‍ය භාග ගාස්තුවෙන් සමන්විත විය. කෙසේ වුවද ඉහත කොන්ත්‍රාත් කාල පරිච්ජේදය යටතේ අනුග්‍රාහක විසින් සැපයිය යුතු ඇඳුම් අයිතම පිළිබඳ රේටයන් හා ප්‍රමාණයන් ශ්‍රී ලංකා ක්‍රිකට් ලබාගෙන නොතිබුණු අතර වර්ෂය තුළ ලැබුණු ඇඳුම් අයිතම ප්‍රමාණය හා වටිනාකමද ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගිණුම්ගත කර නොතිබුණි. තවද 2013 පෙබරවාරි 20 වන විටත් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් අනුග්‍රාහක සමඟ ගිවිසුමකට එළඹීමට අපොහොසත් වී තිබුණි.

(iii) 2012 සැප්තැම්බර් 10 දින ශ්‍රී ලංකා ක්‍රිකට් රු.6,000,000 ක් සඳහා ඉන්වොයිසි නිකුත් කර තිබුණද අනුග්‍රාහක විසින් 2012 ඔක්තෝබර් 17 දින රු.5,100,000 ක මුදලක් පමණක් ගෙවා තිබුණු අතර ඉතිරි ශේෂය 2013 ජනවාරි 31 වන විටත් අයකරගෙන නොතිබුණි.

(iv) 2012-2015 ජාතික කණ්ඩායම් ඇඳුම් සැපයීමේ අනුග්‍රාහකත්ව කොන්ත්‍රාත්තුව යටතේ රිබොක් (Reebok) විසින් ඉදිරිපත් කරන ලද රාජ්‍ය භාග ගාස්තුව එ.ජ.ඩො 215,000 ක් විය. කෙසේ වුවද ශ්‍රී ලංකා ක්‍රිකට්හි දුර්වල ප්‍රසම්පාදන කළමනාකරණය හේතුවෙන් 2012 ජුනි 21 දින අනුග්‍රාහක විසින් ලංසුව ඒක පාර්ශවිකව අවලංගු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම කොන්ත්‍රාත්තුව සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නැවත ලංසු කැඳවා තිබූ අතර, නව අනුග්‍රාහක විසින් රාජ්‍ය භාග ගාස්තුව සඳහා එ.ජ.ඩො 104,000 කට (පරිවර්තන රේටය එ.ජ.ඩො 1 = ශ්‍රී ලංකා රු. 125) ලංසු යෝජනාව ඉදිරිපත් කර තිබුණි. අවසානයේදී ප්‍රථම ලංසුව ඉදිරිපත් කරන ලද රිබොක් සමඟ ගිවිසුම අත්සන් නොකිරීම හේතුවෙන් එ.ජ.ඩො 111,000 ක ඇස්තමේන්තුගත පාඩුවක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත සිදුවී තිබුණි.

**(ඕ) සේවා කොන්ත්‍රාත්තු අවසන් කිරීම සහ නීතිමය ක්‍රියාවලිය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 ඔක්තෝබර් 01 සිට ආරම්භවන වර්ෂ දෙකක කාලපරිච්ජේදයක් සඳහා ප්‍රධාන ජාතික පුහුණුකරුවකු ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් බඳවා ගෙන තිබුණද, එම සේවා කොන්ත්‍රාත්තුව 2012 ජනවාරි 25 සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ඒකපාර්ශවිකව අවසන් කර තිබුණි. පුහුණුකරු සේවාදායකගෙන් එ.ජ.ඩො 250,000 ක් හිමිකම් ඉල්ලමින් 2012 ජුලි 18 දින ගොනු කරන ලද නඩුව 2013 මාර්තු 31 වන විටත් තීන්දුව සඳහා පවතින අතර ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම සඳහා නව ප්‍රධාන පුහුණුකරුවකු 2012 ජනවාරි 25 දින සිට ආරම්භ වන පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් බඳවා ගෙන තිබුණි.

(ii) ප්‍රධාන ආරක්ෂක නිලධාරිවරයකු 2012 පෙබරවාරි 01 දිනෙන් ආරම්භවන මාස 10 ක කාල පරිච්ජේදයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් බඳවා ගෙන තිබුණි. පසුව කොන්ත්‍රාත් කාලය අවසන් වීමට ප්‍රථම ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එම සේවා කොන්ත්‍රාත්තුව ඒකපාර්ශවිකව අවලංගු කර තිබුණි. ප්‍රධාන ආරක්ෂක නිලධාරින් විසින් සේවාදායකගෙන් රු.50,000,000 ක අලාභයක් ඉල්ලමින් කම්කරු අධිකරණයේ ගොනු කරන ලද නඩුව 2013 මාර්තු 31 වන විටත් අවසන් වී නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එළඹි ගිවිසුම් ඒකපාර්ශවිකව උල්ලංඝනය කිරීම හේතුවෙන් බාහිර පාර්ශවයන් දෙකක් විසින් එකතුව රු.46,968,918 ක් වූ අලාභයක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙතින් ඉල්ලා තිබුණි. අනෙක් අතට එම බාහිර පාර්ශවයන් විසින් ගිවිසුම් කඩ කළ බව දක්වමින් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් එකතුව රු.351,300,000 ක අලාභ ඉල්ලා තිබුණි.

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් එරෙහිව බාහිර පාර්ශවයන් විසින් ගොනු කරන ලද උසාවි නඩු හා බාහිර පාර්ශවයන්ට එරෙහිව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගොනු කරන උසාවි නඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් පිළිවෙලින් රු.836,890 ක් හා රු.7,162,630 ක් වූ නීති ගාස්තු වැයකර තිබුණි.

**(ක) මෙහෙයුම් සමාලෝචනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් පුහුණුකරු 2012 ඔක්තෝබර් 10 දින සේවයෙන් ඉවත්වී තිබුණද, 2012 ඔක්තෝබර් හා නොවැම්බර් යන මාස දෙක සඳහා වැටුප් ලෙස රු.99,174 ක මුදලක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද වැඩිපුර ගෙවා ඇති වැටුප් ආපසු අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් පියවර ගෙන නොතිබුණි.

(ii) 2010 පවත්වන ලද ජාත්‍යන්තර ඉන්දියානු චිත්‍රපටි ඇකඩමියේ (IIFA) අසරණ සරණ ක්‍රිකට් තරඟාවලිය යටතේ “ළමුන් සඳහා ක්‍රිකට් ආරම්භයකට ආධාර" "In Aid of Cricket for Children Initiate" සඳහා අරමුදලක් ස්ථාපිත කිරීම පිණිස අනුග්‍රාහක විසින් 2010 දෙසැම්බර් 17 දින රු.2,554,609 ක මුදලක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමට හැකි වන පරිදි වෙනම ගිණුමක මෙම අරමුදල් ආයෝජනය කර නොතිබුණි.

(iii) 2009 සිට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා රු.850,000 ක කොන්ත්‍රාත් මුදලකට ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් පුද්ගලික විගණන ආයතනයකට 2009 අගෝස්තු 25 දින කාර්ය පැවරීමක් ලබාදී තිබුණි. පසුව 2011 අගෝස්තු 04 දින රු.342,720 ක මුදලක් අත්තිකාරමක් ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද එම ගිණුම්කරණ ආයතනය විසින් 2013 ජනවාරි 20 වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් විධිමත් චෙක්පත් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට අදාල පාර්ශවයන් වෙත භාරදීමෙන් තොරව රු.4,379,998 ක් වටිනාකම වූ චෙක්පත් 90 ක් අත රඳවා ගෙන තිබුණි.

**(ග) ශ්‍රී ලංකා ප්‍රිමියර් ලිග් ( SLPL) - 2012**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් සහ අනුග්‍රාහක අතර 2012 මැයි 05 දින අත්සන් කරන ලද ගිවිසුමේ 5(9) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රිමියර් ලිග් 2012 සඳහා අනුග්‍රාහකත්ව ගාස්තු ලෙස එ.ජ.ඩො 300,000 ක් ගෙවීමට අනුග්‍රාහක එකඟවී තිබුණි. කෙසේ වුවද

අනුග්‍රාහක විසින් එ.ජ.ඩො 210,000 ක් පමණක් ගෙවා තිබූ අතර ඉතිරි එ.ජ.ඩො 90,000 ක මුදල 2013 පෙබරවාරි 20 වන විටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ii) 2012 මැයි 05 දින ශ්‍රී ලංකා ක්‍රිකට් හා අනුග්‍රාහක අතර අත්සන් කරන ලද වරලත් ගිවිසුමේ 9.2 වගන්තිය ප්‍රකාරව කණ්ඩායම් විසින් අවසාන තරඟය පැවැත්වීමෙන් පසු දින 10 ක් ඇතුළත ක්‍රීඩා භූමි කුලියට ගැනීමේ ගාස්තු ගෙවිය යුතුය. කෙසේ වුවද එකතුව රු.1,249,528 ක් වූ ක්‍රීඩා භූමි කුලී ගාස්තු වරලත් ආයතන 2 කින් අයකර ගැනීමට 2013 පෙබරවාරි 20 වන විටත් ශ්‍රී ලංකා ක්‍රිකට් අපොහොසත්වී තිබුණි.

(iii) අනුග්‍රාහක සහ ශ්‍රී ලංකා ක්‍රිකට් අතර 2012 මැයි 05 දින එළඹී ගිවිසුමෙහි ප්‍රමාද ගෙවීම් පිළිබඳ දඩ මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගන්තියක් ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වරලත් ආයතන 4 කින් පන්දු විකුණුම් සම්බන්ධයෙන් පැවති රු.2,889,129 ක්වූ හිඟ ශේෂය 2013 පෙබරවාරි 20 වන විටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(iv) ශ්‍රී ලංකා ප්‍රිමියර් ලීග් (SLPL) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් හා සීමාසහිත සමර්සෙට් එන්ටර්ටේන්මන්ට් වෙන්චර්ස් (පුද්ගලික) සමාගම අතර 2013 ඔක්තෝබර් 13 හා 2012 මැයි 05 (සංශෝධිත) දිනයන්හි ගිවිසුම්වලට එළඹ තිබුණි. කෙසේ වුවද අනුග්‍රාහකත්වය පිළිබඳ අධිහාර, ප්‍රමාද ගෙවීම් සහ ගිවිසුම් පිළියෙල කිරීම පිළිබඳ නීති ගාස්තු දැරීමේ ආකාරය සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගිවිසුම් පිළියෙල කිරීම පිළිබඳ නීති ගාස්තු ලෙස දරන ලද රු.12,210,000 ක් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් දරා තිබුණි.

**(ච) උපදේශක ගාස්තු - රු.12,902,250 සහ වෙනත් වියදම් රු.2,507,462**

දේශීය ක්‍රිකට් ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම හා රටෙහි ක්‍රිකට් පරිපාලනය වැඩිදියුණු කිරීමට මණ්ඩලයට සහයවීමට 2012 ජූලි 15 දිනෙන් ආරම්භ වන මාස 3 1/2 ක කාල පරිච්ජේදයක් සඳහා විශේෂ උපදේශකවරයකු ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් යොදා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගුවන් ටිකට්පත් පිරිවැය, හෝටල්වල නැවතීමේ ගාස්තු, දින දීමනා හා වීසා ගාස්තු වශයෙන් 2012 නොවැම්බර් 17 සිට 22 දක්වා කාලපරිච්ජේදය සඳහා රු.789,671 ක් දරා තිබුණු අතර විධායක කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2012 ජූලි 04 දින ගුවන් ටිකට්පත් වියදම් ලෙස රු.163,671 ක මුදලක් උපදේශකට ප්‍රතිපූර්ණය කර තිබුණි. තවද ගිවිසුම ආරම්භයට පෙර එම ගෙවීම සිදුකර තිබූ බව අනාවරණය විය.

(ii) ගිවිසුමේ 3.2 වගන්තිය අනුව, කොන්ත්‍රාත් කාලය තුළ උපදේශක සඳහා වගකීම පවරා තිබූ කාලයෙන් දළ වශයෙන් දින 25 ක වෘත්තීය කාලය හා සේවාව අපේක්ෂා කර තිබුණි. මෙය ශ්‍රී ලංකාවේ දින පහේ සිට දහය දක්වා පමණ වූ සැසි තුනකින් ඇතුළත්ව තිබුණි. කෙසේ වුවද උපදේශන ගමනේ යෙදුනු දිනයන්ද ඇතුළත්ව ශ්‍රී ලංකාවේ දින 21 ක් පමණක් ගත කර තිබුණද ගිවිසුම ප්‍රකාරව එකඟවූ ගාස්තු ගෙවා තිබුණි.

**(ජ) ජාත්‍යන්තර රූපවාහිනී හිමිකම්**

2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතන චක්‍රලේඛය අනුගමනය කිරීමෙන් තොරව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ජාත්‍යන්තර රූපවාහිනී විකාශන හිමිකම් එ.ජ.ඩො. 67,874,000 ක මුදලකට වර්ෂ 3 ක කාලයක් සඳහා 2009 ජනවාරි 22 දින අනුග්‍රාහකයකුට ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගිවිසුම අනුව, වර්ෂ තුනක කාලයක් සඳහා අනුග්‍රාහකගෙන් ලැබිය යුතු මුළු ආදායම එ.ජ.ඩො 67,874,000 ක් විය. කෙසේ වුවද එ.ජ.ඩො 41,468,167 ක් පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබී තිබුණු අතර ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ අනාගත සංචාර වැඩ සටහනට ඇතුළත් නොකරන ලද තරඟ කිහිපයක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ගිවිසුමේ ඇතුළත් කිරීම හේතුවෙන් එ.ජ.ඩො 26,405,833 ක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ii) 2012 වර්ෂය සඳහා ගිවිසුමේ සංචාර තුනක් ඇතුළත් කර නොතිබුණි. එබැවින් පෙර වර්ෂ සඳහා යොදා ගන්නා ලද රේටයන් 2012 වර්ෂය සඳහාද සලකා තිබුණි.

(iii) ගිවිසුමේ 4.1.1 වගන්තිය ප්‍රකාරව, සංචාරය ආරම්භ කිරීමට පෙර දින 30 ක් ඇතුළත එකඟවූ මුදලින් සියයට 50 ක් රැස්කර ගත යුතුය. කෙසේ වුවද එකතුව එ.ජ.ඩො 8,023,583 ක් වූ ගෙවීම දින 09 සිට දින 20 දක්වා කාලයක් අනුග්‍රාහක විසින් ප්‍රමාද කර තිබුණි.

(iv) ගිවිසුමේ 4.1.2 වගන්තිය ප්‍රකාරව සංචාරය ආරම්භ වීමේදී එකඟවූ මුදලින් සියයට 35 ක් රැස්කර ගත යුතුය. කෙසේ වුවද එකතුව එ.ජ.ඩො 5,616,508 ක ගෙවීම් අනුග්‍රාහකවිසින් දින 12 සිට දින 43 දක්වා ප්‍රමාද කර තිබුණි.

(v) ගිවිසුමේ 4.1.3 වගන්තිය ප්‍රකාරව සංචාරය අවසන්වීමට පෙර දින 7 ක් ඇතුළත එකඟවූ මුදලින් සියයට 15 ක් රැස්කර ගත යුතුය. කෙසේ වුවද එකතුව එ.ජ.ඩො 2,407,075 ක් අනුග්‍රාහක විසින් දින 17 සිට දින 75 ක් ප්‍රමාද කර තිබූ අතර නවසීලන්ත සංචාරයට අදාළව එ.ජ.ඩො 54,750 ක අනුග්‍රාහකත්ව ගාස්තු 2013 පෙබරවාරි 20 දින වන විටත් අනුග්‍රාහක විසින් නිරවුල් කර නොතිබුණි.

(vi) ශ්‍රී ලංකා ක්‍රිකට් සහ අනුග්‍රාහක අතර වූ ගිවිසුමේ ප්‍රමාද ගෙවීම් මත දඩ මුදලක් පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ශ්‍රී ලංකා ක්‍රිකට් දුර්වල කළමනාකරණය හේතුවෙන් අනුග්‍රාහක විසින් අනවශ්‍ය පරිදි ගෙවීම් ප්‍රමාද කර තිබූ අතර එය ශ්‍රී ලංකා ක්‍රිකට් මුදල් ප්‍රවාහයට සෘණාත්මක බලපෑමක් ඇති කර තිබුණි.

**(ට) රූපවාහිනී විකාශන හිමිකම්**

2012 මාර්තු 01 දිනෙන් ආරම්භවන වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් සඳහා රු.125,000,000 ක මුදලකට රූපවාහිනී විකාශන හිමිකම් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් 2012 මාර්තු 22 දින පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා ප්‍රධාන ආදායම් ප්‍රභවය රූපවාහිනී විකාශන ආදායම වුවද රූපවාහිනී විකාශන හිමිකම් සඳහා අනුග්‍රාහකයකු තෝරා ගැනීමට ලංසු කැඳවීමේදී

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 3.2 හා 6.2.2 ප්‍රකාරව ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදීමෙන් තොරව කුඩා ප්‍රමාණයේ දැන්වීමක් 2012 පෙබරවාරි 05 දින පළ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එක් ලංසුවක් පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ලැබී තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 6.2.2 ප්‍රකාරව ලංසුකරුවන්ට තම ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදී නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.14.1 ප්‍රකාරව කොන්ත්‍රාත්තු වටිනාකම රු.මිලියන 50 ඉක්මවන්නේ නම් එය අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයට යොමු කළ යුතු තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) නිර්දේශය ලබාගැනීමෙන් තොරව 2012 අප්‍රේල් 05 දින ශ්‍රී ලංකා ක්‍රිකට් විධායක කමිටුව විසින් එකී ටෙන්ඩරය අනුමත කර තිබුණු අතර, ගිවිසුම අත්සන් කිරීමේදී ලංසු ඇපකරය හා බැංකු සහතිකය ලබාගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් අපොහොසත්වී තිබුණි.

(iii) ගිවිසුමේ 3.4.1 වගන්තිය ප්‍රකාරව, තරඟ ආරම්භයට පෙර එකඟවූ මුදලින් සියයට 25 ක් රැස්කර ගත යුතුය. කෙසේ වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් දුර්වල කළමනාකරණය හේතුවෙන් එකතුව රු.17,050,000 ක්වූ ගෙවීම අනුග්‍රාහක විසින් දින 8 සිට දින 183 ක් ප්‍රමාද කර තිබුණි.

(iv) ගිවිසුමේ 3.4.2 වගන්තිය ප්‍රකාරව, තරඟ නිම කිරීමට පෙර එකඟවූ මුදලින් සියයට 25 ක් රැස්කර ගත යුතුය. කෙසේ වුවද ශ්‍රී ලංකා ක්‍රිකට්හි දුර්වල කළමනාකරණය හේතුවෙන් අනුග්‍රාහක විසින් එකතුව රු.12,812,500 ක් වූ ගෙවීම දින 11 සිට දින 176 ක් ප්‍රමාද කර තිබුණි.

(v) ගිවිසුමේ 3.1.2 වගන්තිය ප්‍රකාරව, තරඟ අවසානවීමට පෙර දින 30 ක් ඇතුළත එකඟවූ මුළු මුදල රැස්කර ගත යුතුය. කෙසේ වුවද ශ්‍රී ලංකා ක්‍රිකට් හි දුර්වල කළමනාකරණය හේතුවෙන් එකතුව රු.14,100,000 ක ගෙවීම් අනුග්‍රාහක විසින් දින 45 සිට දින 176 ක් ප්‍රමාද කර තිබුණි.

(vi) ශ්‍රී ලංකා ක්‍රිකට් හා අනුග්‍රාහක අතර අත්සන් කරන ලද ගිවිසුමේ ප්‍රමාද ගෙවීම මත දඩ මුදල පිළිබඳව වගන්තියක් ඇතුළත් කර නොතිබුණු අතර ගෙවීම් සඳහා නියමිත දිනට පෙර ඉන්වොයිසි නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් විධිමත් පියවර ගෙන නොතිබුණි. එබැවින් එම මුදල නිරවුල් කිරීම සඳහා අනුග්‍රාහක විසින් තමාට අවශ්‍ය පරිදි කාලය ලබාගෙන තිබුණි.

**(ඩ) දේශීය තරඟාවලි - 2012**

---

සමාලෝචිත වර්ෂය තුලදී තරඟාවලි 22 කින් රු.මිලියන 255.26 ක ආදායමක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ඇස්තමේන්තු කර තිබුණු අතර තථ්‍ය ආදායම සියයට 23 සිට සියයට 413 කින් ඉක්මවා තිබුණි. තවද විනිසුරු ගාස්තු, තරඟ තීරක ගාස්තු ඇස්තමේන්තුවල ඇතුළත් කර නොතිබුණු අතර තරඟාවලි 16 ක් සඳහා විනිසුරු ගාස්තු හා තරඟ තීරක ගාස්තු ලෙස ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් රු.16,542,507 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද "විනිසුරු ගාස්තු "හා "තරඟ තීරක ගාස්තු" රේටයන් හා ගෙවීම් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ණ) බියර් විකිණීමේ අනුග්‍රාහකත්ව හිමිකම**

වර්ෂ 3 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් හා අනුග්‍රාහක විසින් අත්සන් කරන ලද බියර් විකිණීමේ ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බියර් විකිණීමේ හිමිකම් සඳහා තෝරා ගැනීමේදී හා ප්‍රදානය කිරීමේදී 2006 ජනවාරි 25 දින නිකුත් කරන ලද ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් අපොහොසත් වී තිබුණි. තවද එළඹෙන ලද ගිවිසුමේ, ප්‍රමාද ගෙවීම් සඳහා පනවන දඩ මුදල සම්බන්ධයෙන් වගන්තියක් ඇතුළත් කර නොතිබුණු බව අනාවරණය විය.

(ii) ගිවිසුමේ 2.2 වගන්තිය ප්‍රකාරව, ගිවිසුම අත්සන් කිරීමේදී අනුග්‍රාහක විසින් රු.1,800,000 ක මුදලක් 2012 මාර්තු 01 දින ගෙවීම අවශ්‍ය විය යුතු විය. කෙසේ වුවද, අනුග්‍රාහක විසින් ගෙවීම කර තිබුණේ දින 319 ක ප්‍රමාදයක් සහිතව 2013 ජනවාරි 13 දිනදීය.

(iii) ගිවිසුමේ 2.3 හා 2.4 වගන්තිය ප්‍රකාරව, ජාත්‍යන්තර ටෙස්ට් තරඟ හා ජාත්‍යන්තර එක් දින තරඟ ආරම්භවීමට පෙර, දින 3 ක් ඇතුළත රු.500,000 ක් හා ටී 20 තරඟය සම්බන්ධයෙන් රු.400,000 ක් ගෙවීමට අවශ්‍ය වී තිබුණි. ඊට අමතරව එංගලන්තයට එරෙහිව ශ්‍රී ලංකාව අතර එක් එක් ටෙස්ට් තරඟ සඳහා රු.1,500,000 ක මුදලක් ගෙවීමට අනුග්‍රාහක විසින් එකඟවී තිබුණි. කෙසේ වුවද අනුග්‍රාහකගෙන් ගාස්තු අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් කාලීනව පියවර ගෙන නොතිබුණි.

(iv) තරඟ ආරම්භ වීමට පෙර, දින 3 ක් ඇතුළත එකඟවූ මුදල රැස්කර ගත යුතු වුවද, අනුග්‍රාහක විසින් එකතුව රු.9,800,000 ක ගෙවීම දින 3 සිට දින 51 ක් ප්‍රමාද කර තිබුණි.

(v) නවසීලන්ත සංචාරය 2012 ඔක්තෝබර් 30 සිට නොවැම්බර් 29 දක්වා කාලය තුළ පවත්වාතිබුණද, රු.3,300,000 ක මුදලක් 2013 පෙබරවාරි 20 දිනට අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

**(ත) දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය නඩත්තු කිරීම**

2002 වර්ෂයේදී බදුකර ඉඩමක ඉහත ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා දළ වශයෙන් රු.මිලියන 700 ක මුදලක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් වැයකර තිබුණු අතර බදුකරුට වාර්ෂික බදු කුලිය වූ රු.340,000 ක් ගෙවා තිබුණි. ක්‍රීඩා භූමිය නඩත්තු කිරීම සඳහා රු.7,556,447 ක් (වැටුප් හැර) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙනුවෙන් රු.49,864,346 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වුවද ක්‍රිඩාංගනය කුලියට දීම මඟින් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,199,033 ක් පමණක් උපයා තිබුණි. තවද 2011 හා 2012 වර්ෂ තුළදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද ජාත්‍යන්තර ක්‍රිකට් තරඟාවලි සඳහා පිළිවෙලින් රු.4,477,552 කට හා රු.3,185,535 කට කොළඹ ක්‍රිකට් ක්‍රීඩාංගන දෙකක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් කුලියට ගෙන තිබුණු අතර එම ක්‍රීඩාංගන ජාත්‍යන්තර තරඟාවලි පැවැත්වීම සඳහා යොදා නොගැනීම පිළිබඳව හේතුවූ කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ද) මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් සමරු වෙළඳ සැල 2009 ජුනි 01 දිනෙන් ආරම්භ වන වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් සඳහා රු.150,000 ක ත්‍රෛමාසික කුලියකට බදුදී තිබුණි. ගිවිසුම අනුව, එක් එක් කාර්තුව ආරම්භ වීමට පෙර කුලී මුදල් ගෙවීමට බදුකරු එකඟවී තිබුණි. කෙසේ වුවද 2009 ජුනි 06 සිට 2011 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ රු.1,744,250 ක බදු මුදල් මාස 24 ක ප්‍රමාදයක් සහිතව 2011 ජුනි 09 දින ගෙවා තිබූ අතර එම ප්‍රමාද ගෙවීම් සඳහා කිසිඳු මුදලක් අයකර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් සහ බදුකරු අතර අත්සන් කරන ලද ගිවිසුමේ 9 වගන්තියට පටහැනිව, 2012 ජුනි 01 සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.240,000 ක ත්‍රෛමාසික කුලියට එම බදුකරුටම සමරු වෙළඳසැල කාර්තු දෙකක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් නැවත බදුදී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.80,000 ක් වූ එක් මාසයක කුලිය ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත අහිමිවී තිබුණි. තවද අවබෝධතා ගිවිසුමේ, බදු මුදල් ගෙවිය යුතු දිනය පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව, ත්‍රෛමාසික ගෙවීම බදුකරු විසින් මාස දෙකේ සිට මාස හතර දක්වා ප්‍රමාද කර තිබුණු අතර අවබෝධතා ගිවිසුමේ සඳහන් කරන ලද කාලය දීර්ඝ කිරීමෙන් තොරව සමරු වෙළඳ සැල පවත්වා ගැනීම සඳහා ඉහත පාර්ශ්වයට ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ඉඩදී තිබුණි.

**(හ) කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) එකතුව රු.39,886,726 ක් වටිනා ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්කරුවන් 07 දෙනෙකුට ප්‍රදානය කිරීමේදී ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළේද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරන ලද එම ඉදිකිරීම් වැඩ සඳහා පූර්ව අනුමැතීන් විධායක කමිටුව විසින් ලබාදී නොතිබුණු බව අනාවරණය විය.

(ii) ප්‍රමාණ පත්‍ර, ඇස්තමේන්තු, පිරිවිතරයන් හා තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) අනුමැතිය සැලකිල්ලට ගැනීමෙන් තොරව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් කොන්ත්‍රාත්කරුවන් සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 4 කදී ටෙන්ඩර් කැඳවීමෙන් තොරව, රු.1,928,112 ක් වටිනා ඍජු මිලදී ගැනුම් ඇණවුම් සැපයුම්කරුවන්ට/ කොන්ත්‍රාත්කරුවන්ට නිකුත් කිරීම මඟින් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශයට පටහැනිව, එක් එක් කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත් මුදලින් සියයට 25 සිට සියයට 75 කින් යුතු එකතුව රු.17,767,323 ක් වූ අත්තිකාරම් අවස්ථා 10කදී ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි.

**(ප) මානව සම්පත් කළමනාකරණය**

**කාර්ය මණ්ඩල තත්ත්වය**

ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙක සඳහා තථ්‍ය කාර්ය මණ්ඩල තත්ත්වයන් පහත දැක්වේ.

| වර්ගය | දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථිර | | | කොන්ත්‍රාත් | | | එකතුව | | |
| | 2012 | 2011 | 2010 | 2012 | 2011 | 2010 | 2012 | 2011 | 2010 |
| කළමනාකරණ | 04 | 01 | 03 | 63 | 48 | 56 | 67 | 49 | 59 |
| විධායක | 07 | 09 | 09 | 61 | 55 | 86 | 68 | 64 | 95 |
| ලිපිකරු හා වෙනත් | 12 | 14 | 15 | 72 | 74 | 98 | 84 | 88 | 113 |
| එකතුව | 23 | 24 | 27 | 196 | 177 | 240 | 219 | 201 | 267 |

**(ඔ) බඳවා ගැනීම් හා පුද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේදී රු.1,460,000 ක පිරිවැයකට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් පිළියෙල කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණි.

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් රහස්‍ය ලේකම් තනතුර සහ මාධ්‍ය හා සන්නිවේදන කළමනාකරු තනතුර සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද නොමැති නිලධාරින් 2012 ජුනි 01 දින බඳවා ගෙන තිබුණි. තවද එම ඉල්ලුම්කරුවන් දෙදෙනාම ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට දින 1 සිට 13 දක්වා ප්‍රමාදවී ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර තිබුණි.

(iii) 2012 සැප්තැම්බර් 01 දින වර්ෂ 01 ක කොන්ත්‍රාත් කාලපරිච්ඡේදයකට අවශ්‍ය සුදුසුකම් සැලකිල්ලට ගැනීමෙන් තොරව, ආරක්ෂණ හා දූෂණ මර්දන-කළමනාකරු ලෙස වයස අවුරුදු 69 ක් වූ පුද්ගලයකු බඳවා ගෙන තිබුණි. තවද ඒ සඳහා වූ ඔහුගේ ඉල්ලුම්පත්‍රය 2012 මැයි 31 ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට් ප්‍රධාන විධායක නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එය 2012 ජුනි 14 දින ටී-20 ලෝක කුසලාන කාර්යාලයේ ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි.

(iv) පළාත් හා දිස්ත්‍රික් පුහුණුකරුවන් 24 දෙනෙකු වර්ෂ දෙකක කාල පරිච්ඡේදයක් සඳහා 2012 මැයි 15 දින බඳවා ගෙන තිබුණි. කෙසේ වුවද පුහුණුකරුවන් 5 දෙනෙකුගේ ජීව-දත්තයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව අවශ්‍ය සුදුසුකම් පුහුණුකරුවන් සතු වූයේ ද යන්න විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(v) සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 33 දෙනෙකුට අදාළව අධ්‍යාපන හා උප්පැන්න සහතික, ලියකියවිලිවල සහතික කළ පිටපත් ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනුවල නොතිබුණි.

**(ම) යහ පාලනය සහ ගිණුම් කටයුතුභාවය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ක්‍රිකට්හි අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කරනු වෙනුවට විගණන වෘත්තියේ යෙදී සිටින ආයතනයකට 2012 ජූලි 12 දින සිට විගණන කටයුතු පවරා තිබුණු අතර ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කිරීමට හා අවම වශයෙන් මාස 3 කට වරක් රැස්වීම් පැවැත්වීමට ශ්‍රී ලංකා ක්‍රිකට් අපොහොසත්වී තිබුණි.

(iv) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛයේ 4.2.1 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් ශ්‍රී ලංකා ක්‍රිකට් විසින් පිළියෙල කර නොතිබුණි.

**3.14 ක්‍රීඩා සංගම් විසින් ගිණුම් ඉදිරිපත් කිරීම**

1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනත අනුව සියළුම ක්‍රීඩා සංගම් විසින් වාර්ෂික ගිණුම් ප්‍රකාශ විගණනය සඳහා විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණන සමාගමක් වෙත ඉදිරිපත් කර ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රීඩා සංගම් 12 ක් විසින් 2012 වර්ෂයට අදාල අවසන් ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.